# 2018 වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயற்பாட்டு அறிக்கை
# Annual Performance Report

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
மாநகர மற்றும் மேல் மாகாண அபிவிருத்தி அமைச்சு
Ministry of Megapolis and Western Development



**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

# *වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018*


**17 මහල, සුහුරුපාය, සුභූතිපුර පාර, බත්තරමුල්ල**

**දුරකථන : 0112 864 770 /0112 866 447**
**ෆැක්ස් : 0112 887 909**
**විද්‍යුත් තැපැල : info@megapolismini.gov.lk**
**වෙබ් අඩවිය : www.megapolismin.gov.lk**

# මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

## ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා (පා.ම.)

### අමාත්‍ය, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

**අමාත්‍යාංශයේ ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්**

**නිහාල් රූපසිංහ මහතා**

*ලේකම්, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය*

**එස්.එම්. පියතිස්ස මහතා**

*අතිරේක ලේකම් (පාලන)*

**ඩබ්ලිව්.එම්.කේ.පී.එස්.ආර්. ප්‍රනාන්දු මහතා**

*අතිරේක ලේකම් (තාක්ෂණ)*

**මාධව වෛද්‍යරත්න මහතා**

*අතිරේක ලේකම් (මහානගර)*

**අංජලී දේවරාජා මිය**

*අතිරේක ලේකම් (මහානගර තාක්ෂණ හා බස්නාහිර සංවර්ධන)*

පටුන


**1. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය....................................................... 01**

**2. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය ...................................................................... 02**

**3. ආංශික කාර්යසාධනය**

3.1 පාලන අංශය

3.1.1 පාලන ශාඛාව ........................................................................................ 03-07

3.1.2 සැලසුම් හා මෙහෙයුම් ශාඛාව ................................................................ 08-09

3.2 ගිණුම් අංශය ............................................................................................ 09-13

3.3 නාගරික සංවර්ධන අංශය

3.3.1 නාගරික සංවර්ධන ශාඛාව..................................................................... 13-14

3.3.2 ඉඩම් ශාඛාව ....................................................................................... 15

3.4 මහානගර අංශය ........................................................................................ 15-17

3.5 තාක්ෂණ අංශය

3.5.1 තාක්ෂණ ශාඛාව ............................................................................... 17-19

3.5.2 තොරතුරු තාක්ෂණ ශාඛාව ................................................................... 19-20

3.6 අභ්‍යන්තර විගණන අංශය ........................................................................... 20

**4. අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යවස්ථාපිත ආයතන සහ දෙපාර්තමේන්තු ............................. 21**

**5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති**

5.1 විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති .................................................. 22-23

5.2 දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති .................................................... 23-26

# 1. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

**දැක්ම**

ජනතාවගේ ආර්ථික හා ආධ්‍යාත්මික යහපැවැත්ම මෙන්ම ස්වභාව ධර්මය සමග සුසංයෝගී වූ ප්‍රියමනාප දිවිපැවැත්මක් සහතික කරන තිරසර නාගරික ජීවිතයක්

**මෙහෙවර**

විශිෂ්ට නගර සැලසුම් හා ඉංජිනේරු නිපුණතා, අතිනවීන තාක්ෂණය සහ ලෝකයේ විශිෂ්ට භාවිතාවන් යොදා ගනිමින්, රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානවල මැනවින් සැලසුම් කරන ලද හරිත, පවිත්‍ර සහ සුහුරු නාගරික ජනාවාස නිර්මාණය කිරීම තුළින් දේශයේ ආර්ථික සමෘද්ධිය සාක්ෂාත් කරගැනීම සහ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම

**අරමුණු**

අමාත්‍යාංශයේ මූලික අරමුණ වන්නේ ජන ජීවිතයේ ගුණාත්මකභාවය ඉහළ මට්ටමකින් පවත්වා ගන්නා අතරම නාගරික ප්‍රදේශවල වාසය කරන ජනතාව රටේ සමාජ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයේ කොටස්කරුවන් වන බවට සහතික කරන්නා වූ විධිමත් වෙනස්කම් සහ සංවර්ධන ක්‍රියාදාමයන් නාගරික ප්‍රජාව වෙත ගෙන ඒමය. මෙමගින් ශ්‍රී ලංකාව ආසියාවේ වාණිජ, නාවික හා ගුවන් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීමේ මග සැලසෙයි.

මෙම අමාත්‍යාංශයේ මූලික වගකීම් අතරට සමස්ථ ශ්‍රී ලංකාවටම අදාළ ජාතික භෞතික සැලසුම සකස් කිරීමත්, උපාය මාර්ගික හා පොදු නාගරික සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමත් ඇතුළත් වේ. එසේම මීළඟ වසර පහ තුළ සමස්ත බස්නාහිර පළාතේ පරිපූර්ණ සංවර්ධනයක් ඇති කරලීමේ අරමුණින් එය මහානගරයක් බවට පරිවර්තනය කිරීමට අමාත්‍යාංශය අපේක්ෂා කරයි.

බස්නාහිර කලාප මහානගර සංවර්ධන ක්‍රියාවලිය ශ්‍රී ලංකාවේ දිගු කාලීන හා මැනවින් ප්‍රතිෂ්ඨාපිත, තිරසර අනාගත නාගරික ක්‍රියාදාමයට මග හෙළිකරන සංවර්ධන අපිකේන්ද්‍රයක් සේ ක්‍රියාකරනු ඇත. රටේ ක්‍රමෝපායික වශයෙන් වැදගත් ස්ථානයන්හි සුහුරු නාගරික ජනාවාස සැලසුම් කිරීමට අමතරව නාගරීකරණය නිසා නිර්මාණය වූ කැලිකසල, මුඩුක්කු, බලශක්තිය, රථවාහන තදබදය, පරිසරය සහ ජීවනෝපාය ආශ්‍රිතව හටගත් නිශ්චිත ගැටළු සඳහා අවශ්‍ය විසඳුම් ලබාදීමට ද වැයම් කරනු ඇත.

**අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන**

- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- නාගරික සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව

**අමාත්‍යාංශය යටතේ පවතින දේශීය අරමුදල් ව්‍යාපෘති**

- වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- කොළඹ අගනගරය ආශ්‍රිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය
- සහසර ව්‍යාපෘතිය
- ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කිරීම
- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

**අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක විදේශීය අරමුදල් ව්‍යාපෘති**

- උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (මහනුවර, ගාල්ල, යාපනය, අනුරාධපුරය, කුරුණෑගල, දඹුල්ල, ත්‍රිකුණාමලය, රත්නපුරය)
- කොළඹ නගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය (3K)
- සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය (ජයිකා)

## 2. අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය

කරුණාකර ඇමුණුම අංක 01 බලන්න ( 27 පිටුව )

# 3. ආංශික කාර්යසාධනය

## 3.1 පාලන අංශය

පාලන ශාඛාව සහ සැලසුම් හා මෙහෙයුම් ශාඛාව මෙම අංශය යටතේ පවතී.

### 3.1.1 පාලන ශාඛාව

**වගකීම**

අදාල කාර්යයන් කාර්යක්ෂමව, කඩිනම්ව, ගුණාත්මකව හා අඛණ්ඩව රජයේ නීතිරීති හා චක්‍රලේඛවලට අනුකූලව ඉටු කිරීම.

**ශාඛාව මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

අමාත්‍යාංශ නිලධාරීන්ගේ සහ අමාත්‍ය කාර්යමණ්ඩලයේ නිලධාරීන්ගේ සියලුම ආයතන කටයුතු මෙන්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ ව්‍යාපෘතිවල සේවයේ නියුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉටු කළ යුතු සියලුම ආයතන කටයුතු

**අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු**

| කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව | 2018.12.31 දිනට සිටි සංඛ්‍යාව | පුරප්පාඩු/අතිරික්ත (ඇත්නම්) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 39 | 31 | 08 (පුරප්පාඩු) |
| තෘතීයික | 06 | 02 | 04 (පුරප්පාඩු) |
| ද්විතීයික | 96 | 84 | 12 (පුරප්පාඩු) |
| ප්‍රාථමික | 44 | 38 | 06 (පුරප්පාඩු) |
| **එකතුව** | **185** | **155** | **30 (පුරප්පාඩු)** |

**අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ වෙනස්වීම්**

| කාණ්ඩය | 2018.12.31 දිනට | | | |
|---|---|---|---|---|
| | ස්ථාන මාරු වී ගිය | ස්ථාන මාරු වී පැමිණි | විශ්‍රාම ගැනීම් | ඉල්ලා අස්වීම් |
| ජ්‍යෙෂ්ඨ | 04 | 04 | 04 | - |
| තෘතීයික | - | - | 01 | - |
| ද්විතීයික | 11 | 06 | 01 | - |
| ප්‍රාථමික | 06 | - | - | - |
| **එකතුව** | **21** | **10** | **06** | **-** |

**පුහුණුවීම්**

- **දේශීය පුහුණුවීම්**

| වැඩසටහන් ප්‍රමාණය | සහභාගීවූවන් ගණන | අමාත්‍යාංශය දරා ඇති මුළු වියදම (රු.) |
|---|---|---|
| 22 | 102 | 10,59,800.00 |

- **දේශීය පුහුණු - පුහුණු, වැඩමුළු හා සම්මන්ත්‍රණ**

| # | නම සහ තනතුර | සහභාගි වූ වැඩසටහන/පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| 1 | පී. එදිරිසිංහ මිය - ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන) | රාජ්‍ය ලේඛන පරිපාලන සහ ලේඛනාරක්ෂක නීතිය පිළිබඳ එක් දින පාඨමාලාව | 2018.03.20 |
| | | විධායක නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.07.06, 13, 20 |
| 2 | ජී.සී. ගන්නෝරුව මිය - අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | | |
| 3 | ජේ.එම්. දිසානායක මිය - සහකාර ලේකම් (පාලන) | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන සංවිධානය කිරීම | 2018.11.07, 08 |
| | | ව්‍යාපෘති නියාමනය හා ඇගයීම | 2018.09.26 හා 2018.10.27 |

| # | නම සහ තනතුර | සහභාගී වූ වැඩසටහන/පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| 4 | ප්‍රියංගා සේනාරත්න මෙය - සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | ව්‍යාපෘති නියාමනය හා ඇගයීම | 2018.09.26 හා 2018.10.27 |
| | | රාජ්‍ය ප්‍රසම්පාදන කළමනාකරණය | 2018.03.07, 09 |
| 5 | අයි.කේ.ඩබ්.එන්. වික්‍රමරත්න මෙය - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | විධායක නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.07.06, 13, 20 |
| 6 | එන්.ජී.ටී. පෙරේරා මෙය - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | විධායක නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | |
| | | ව්‍යාපෘති නියාමනය හා ඇගයීම | 2018.09.26, 27 |
| 7 | චතුරි විජේසුන්දර මිය - සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | විධායක නිලධාරීන් සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.07.06,13, 20 |
| 8 | රේණුකා දර්ශනී කල්දේරා මිය - පරිපාලන නිලධාරී (වැ.බ.) | විනය කාර්ය පටිපාටිය | 2018.12.13, 20 හා 27 |
| 9 | කේ.ඒ.එස්. පුෂ්පමාලි මිය - සංවර්ධන නිලධාරී | රාජ්‍ය අංශය තුළ අභ්‍යන්තර විගණනය | 2018.02.07, 08 |
| 10 | කේ.ඒ.ඩී. ජයතිස්ස මයා - සංවර්ධන නිලධාරී | වෘත්තීය හැකියාව හා වෘත්තීය හැසිරවීම | 2018.09.26 |
| 11 | ජේ.ඒ. ඉරෝෂා ලක්මාලි මිය - සංවර්ධන නිලධාරී | සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.09.10, 11 |
| | | අභ්‍යන්තර විගණනය | 2018 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල දින 06 ක් |
| 12 | ටී.ඒ.ඊ. ලක්මාලි මිය - සංවර්ධන නිලධාරී | සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.09.10, 11 |
| 13 | පී.කේ.ඊ.ඩී. සේනාරත්න මයා - සංවර්ධන නිලධාරී | රාජ්‍ය අංශය තුළ අභ්‍යන්තර විගණනය | 2018.06.20 - 22 |
| | | සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.09.10, 11 |
| | | අභ්‍යන්තර විගණනය | 2018 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල දින 06ක් |
| 14 | බී.පී. පතිරණ මිය - සංවර්ධන නිලධාරී | පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යාම | 2018.10.12 |
| 15 | වරුණි හතරසිංහ මිය - සංවර්ධන නිලධාරී | සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.09.10, 11 |
| | | අභ්‍යන්තර විගණනය | 2018 සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවල දින 06ක් |
| 16 | සී.කේ. මුණසිංහ මිය - සංවර්ධන නිලධාරී | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 2018.09.13, 14 |
| 17 | අනුර කුමාර සෙනෙවිරත්න මයා - සංවර්ධන නිලධාරී | විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම | 2018.10.22, 23 |
| 18 | ආර්.කේ.ඩී.කේ. රණමුක මෙනවිය - කළමනාකරණ සහකාර | රාජ්‍ය අංශය තුළ අභ්‍යන්තර විගණනය | 2018.02.07, 08 |
| 19 | අයි.ඩී. පෙරේරා මිය - සංවර්ධන නිලධාරී | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 2018.09.13, 14 |
| 20 | ඊ.ආර්.එන්. ඒකනායක මිය - සංවර්ධන නිලධාරී | | |
| 21 | උදානි ඉසංගා මෙය - කළමනාකරණ සහකාර | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 2018.08.16, 17 |
| 22 | එච්.එන්.එම්.එම්. හතුරුසිංහ මයා - කළමනාකරණ සහකාර | සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.09.10, 11 |

| # | නම සහ තනතුර | සහභාගි වූ වැඩසටහන/පාඨමාලාව | කාල සීමාව |
|---|---|---|---|
| 23 | එච්.පී.පී.එච්. දිසානායක මෙය - කළමනාකරණ සහකාර | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2018.10.18, 19 |
| | | පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යාම | 2018.10.12 |
| 24 | එන්.යූ. මලගල මෙය - කළමනාකරණ සහකාර | සහායක කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 2018.09.10, 11 |
| 25 | එම්.ජේ.ඒ.ඩී.එච්.සී. ජයසුන්දර මෙය - කළමනාකරණ සහකාර | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන | 2018.08.02, 03 |
| | | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 2018.08.16, 17 |
| 26 | එල්.එන්. අමරසිංහ මෙය - කළමනාකරණ සහකාර | පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යාම | 2018.10.12 |
| | | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය සහ වගකීම | 2018.03.19, 20 |
| 27 | එල්.කේ.ජී.එස්. ජයන්ති මිය - කළමනාකරණ සහකාර | විනය කාර්ය පටිපාටිය | 2018.09.18, 20 |
| 28 | ජී.කේ. ප්‍රියංකා මල්කාන්ති මිය - කළමනාකරණ සහකාර | වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය කළමනාකරණය | 2018.08.07 |
| 29 | රසාංජලී වර්ණසූරිය මිය - කළමනාකරණ සහකාර | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 2018.09.13, 14 |
| | | නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය සහ වගකීම | 2018.03.19, 20 |
| 30 | ඩබ්.ඒ.ආර්.ඩී.එම්. වික්‍රමසිංහ මිය - කළමනාකරණ සහකාර | කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි | 2018.09.11, 14 |
| 31 | ඩී.ජී.එම්.එච්. ගුණවර්ධන මෙය - කළමනාකරණ සහකාර | ආයතන සංග්‍රහයේ විධිවිධාන පිළිබඳව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන සංවිධානය කිරීම | 2018.03.22, 23 |
| | | පෞද්ගලික ලිපි ගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යාම | 2018.10.12 |
| 32 | ඩී.ඩී. මංචනායක මෙය - කළමනාකරණ සහකාර | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යාම | 2018.03.29 |
| | | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 2018.08.16 ,17 |
| 33 | නයනා එදිරිසිංහ මිය - කළමනාකරණ සහකාර | ගබඩා කළමනාකරණය | 2018.09.20 හා 2018.10.01 |
| 34 | පී.වී.එස්. ප්‍රභාෂා පාදුක්ක මිය - කළමනාකරණ සහකාර | පෞද්ගලික ලිපිගොනුවක් ඵලදායී ආකාරයෙන් පවත්වා ගෙන යාම | 2018.03.29 |
| | | ගිණුම්කරණ කාර්යභාරය හා ප්‍රායෝගික භාවිතය | 2018.08.16 ,17 |
| 35 | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය | දෙමළ භාෂා වාචික පුහුණු පාඨමාලාව | 2018.02.02 සිට සිකුරාදා දිනවල (මාස 06 ක් පමණ) |
| 36 | අමාත්‍යාංශයේ රියදුරු හා කාර්යාල කාර්ය සහායක සේවයේ කාර්ය මණ්ඩලය සඳහා | දෙමළ භාෂා ප්‍රවීණතා ප්‍රායෝගික පැය 50 ක පුහුණු පාඨමාලාව | 2018.02.17 සිට දිනකට පැය 04 බැගින් (පැය 50 ක් ආවරණය වන තෙක්) |
| 37 | අමාත්‍යාංශයේ සංවර්ධන නිලධාරී සේවයේ හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් සඳහා | ලිපි ගොනුකරණය | 2018.06.19 |
| | | ආයතන සංග්‍රහය | 2018.06.22 |

- **විදේශ පුහුණුවීම්**

| වැඩසටහන් ප්‍රමාණය | සහභාගී වූ මාණ්ඩලික නිලධාරීන් ගණන | සහභාගී වූ මාණ්ඩලික නොවන නිලධාරීන් ගණන | අමාත්‍යාංශය දරා ඇති මුළු වියදම (රුපියල්) |
|---|---|---|---|
| 31 | 22 | 04 | 5,074,355.49 |

- **2018 විදේශ පුහුණු - වැඩසටහන්, සම්මන්ත්‍රණ හා දූත මණ්ඩල**

| # | නම හා තනතුර | පාඨමාලාව/වැඩසටහන | රට | කාල සීමාව |
|---|---|---|---|---|
| 1 | ඉංජි. එන්. රූපසිංහ මයා - ලේකම් | කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - දූත මණ්ඩල | චීනය | 2018.09.01-11 |
| | | උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය | ඉරානය | 2018.09.28 - 2018.10.04 |
| 2 | එස්.එම්. පියතිස්ස මයා - අතිරේක ලේකම් (පාලන) | සංවර්ධනය වන රටවල් සඳහා මූලෝපාය උපාය මාර්ග පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2018.07.11 -17 |
| | | ගරු අමාත්‍යවරයා සමග ආයෝජක ප්‍රවර්ධන වැඩසටහන | එංගලන්තය | 2018.10.17 -19 |
| 3 | ඩබ්.එම්.කේ.පී.එස්.ආර් ප්‍රනාන්දු මයා - අතිරේක ලේකම් (තාක්ෂණ) | මහානගර සංවර්ධනය පිළිබඳ ආයෝජන සංසදය | ප්‍රංශය | 2018.07.01- 06 |
| | | ප්‍රතිපත්ති සම්පාදකයින් සඳහා තිරසර හා වැඩිදියුණු කළ සනීපාරක්ෂක ක්‍රමෝපායන් සඳහා නායකත්ව ධාරිතාව ගොඩනැංවීමේ වැඩසටහන | සිංගප්පූරුව | 2018.07.11- 13 |
| | | කසල ට්‍රක්රථ, රසායන ද්‍රව්‍ය ඉසින ට්‍රක්රථ සහ බැකෝ - නැව්ගත කිරීමට ප්‍රථම පරීක්ෂාව | චීනය | 2018.11.28 - 2018.12.09 |
| 4 | මාධව වෛද්‍යාරත්න මයා - අතිරේක ලේකම් (මහානගර) | 19 වන විද්‍යා හා තාක්ෂණ උද්‍යාන වැඩසටහන | කොරියාව | 2018.06.18 -29 |
| | | ශ්‍රී ලංකා ආර්ථික හා ආයෝජන සම්මේලනය - 2018 | චීනය | 2018.09.18 |
| | | ශතවර්ෂ අභියෝග පිළිබඳ සංස්ථා සංයුතික එකඟතාව | ඇමරිකා එ.ජ. | 2018.10.01-05 |
| 5 | එස්.කේ.ඒ.පී. දේවරාජා මිය - අතිරේක ලේකම් (මහානගර තාක්ෂණ හා බස්නාහිර සංවර්ධන) | කොළඹ වරාය නගර ව්‍යාපෘතිය - ක්ෂේත්‍ර චාරිකාව | චීනය | 2018.01.12-17 |
| | | විශේෂ ඇමරිකානු ව්‍යාපාර සීමාවාසික පුහුණුව - ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන | ඇමරිකා එ.ජ. | 2018.04.14-28 |
| | | නගර සංවර්ධනයට මූල්‍ය විසඳුම් | තායිලන්තය | 2018.07.09-13 |
| 6 | එස්.ආර්.බී.ආර්.ජී.සී. ගන්නොරුව මිය - අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | කුවේට් - ශ්‍රී ලංකා වෙළඳාම පිළිබඳ ඒකාබද්ධ කමිටුවේ දෙවන සැසිය | කුවේටය | 2018.10.09-11 |
| 7 | කේ.එස්. මුර මුදලිගේ මිය - අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - අධ්‍යයන චාරිකාව | මැලේසියාව | 2018.10.08-12 |
| 8 | එන්.සී. බටුගෙදර මිය - අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - ක්ෂේත්‍ර චාරිකාව | චීනය | 2018.04.20-25 |
| | | සෞඛ්‍ය සම්පන්න සහ මිත්‍රශීලී නගර සංවර්ධන | | 2018.11.21-22 |
| 9 | එස්.ඩී. ශ්‍රියාලතා මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක | රාජ්‍ය අංශයේ අභ්‍යන්තර විගණකවරුන් සඳහා කළමනාකරණ විගණනය පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන | මැලේසියාව | 2018.01.16-23 |
| | | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - අධ්‍යයන චාරිකාව | ඉන්දියාව | 2018.09.09-15 |
| 10 | එච්.පී.එල්. කුමාර මයා - ප්‍රධාන ගණකාධිකාරී | ගෝලීය ප්‍රසම්පාදන සමුළුව - 2018 | ඉන්දියාව | 2018.02.08-09 |
| | | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - ක්ෂේත්‍ර චාරිකාව | චීනය | 2018.04.20-25 |

| # | නම හා තනතුර | පාඨමාලාව/වැඩසටහන | රට | කාල සීමාව |
|---|---|---|---|---|
| 11 | නෙරංජා ආර්. නිශ්ශංක මිය - ප්‍රධාන ගණකාධිකාරී | ගෝලීය ප්‍රසම්පාදන සමුළුව - 2018 | ඉන්දියාව | 2018.02.08-09 |
| | | ලෝක බැංකු ආධාර සහිත ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි පිළිබඳ පුහුණු වැඩසටහන | | 2018.02.12-23 |
| | | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - අධ්‍යයන චාරිකාව | | 2018.12.03-08 |
| 12 | අනෝජා හේරත් මිය - අධ්‍යක්ෂ (පරිසර) | කොළඹ වරාය නගර ව්‍යාපෘතිය - ක්ෂේත්‍ර චාරිකාව | චීනය | 2018.01.12-17 |
| | | ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - අධ්‍යයන චාරිකාව | මැලේසියාව | 2018.10.14-20 |
| | | නාගරික වායු දූෂණය පිළිබඳ කලාපීය සමුළුව | | 2018.11.13-16 |
| 13 | ජේ.එම්. දිසානායක මිය - සහකාර ලේකම් (පාලන) | ජෛව විවිධත්ව සංරක්ෂණය හා ස්වභාවික රක්ෂිත කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | චීනය | 2018.09.01-21 |
| 14 | එන්.ජී.පී.ජී. සමරවික්‍රම මිය - සහකාර ලේකම් (ආයතන) | සංවර්ධනය වන රටවල් සඳහා යටිතල පහසුකම් ඉදිකිරීම හා සැලසුම් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - 2018 | | 2018.04.10-30 |
| 15 | ප්‍රියංගා සේනාරත්න මෙය - සහකාර අධ්‍යක්ෂ (මහානගර සැලසුම්) | ආයෝජන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා පාරිසරික හා සමාජීය කරුණු සලකා බැලීමේ වැඩසටහන | ජපානය | 2018.11.06-29 |
| 16 | අයි.කේ.ඩබ්.එන්. වික්‍රමරත්න මෙය - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | නාගරික සේවා සැලසුම් කිරීම හා කළමනාකරණය කිරීම | ඉන්දියාව | 2018.01.15 - 2018.03.09 |
| 17 | එන්.ජී.ටී. පෙරේරා මෙය - සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්) | දරිද්‍රතාවය අවම කිරීම හා තිරසාර සංවර්ධනය සඳහා සහභාගිත්ව සැලසුම | | 2018.02.21 - 2018.03.20 |
| 18 | එම්.එස්. රත්නසිංහ මයා - සහකාර අධ්‍යක්ෂ (නාගරික සංවර්ධන) | රාජ්‍ය අංශයේ ප්‍රසම්පාදන කළමනාකරණය | ඉතාලිය | 2018.09.24 - 2018.10.12 |
| 19 | එල්.පී. කොස්තා මිය සහකාර අධ්‍යක්ෂ (නාගරික ඉඩම් කළමනාකරණ) | වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය - දූත මණ්ඩල | චීනය | 2018.09.01-11 |
| 20 | ඩී.එන්. අතුකෝරල මිය - සහකාර අධ්‍යක්ෂ (ඉඩම් සහ සැලසුම්) | | | |
| 21 | ඩබ්.එම්.සී.එස්.කේ. විජේසුන්දර මිය - සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | ආසියානු කලාපය තුළ තිරසාර හා විශ්වාසනීය සේවා සැපයුම් පද්ධතියක් ගොඩනැංවීමේ වැඩසටහන | ජපානය | 2018.05.13 - 2018.06.09 |
| 22 | එස්.එස්.එස්.ඩී. සමරසිංහ මයා - ගණකාධිකාරී | රාජ්‍ය අංශය තුළ අයවැය සම්පාදනය, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය | ඉන්දියාව | 2018.01.15 - 2018.02.02 |
| | | බහු මාධ්‍ය මධ්‍යස්ථානවල මෙහෙයුම් සඳහා පුහුණු සහ අධ්‍යයන වැඩසටහන | මැලේසියාව, ජපානය | 2018.11.18-24 |
| 23 | එල්.එච්.ඩී. ජයන්ත මයා සංවර්ධන නිලධාරී | ලෝක බැංකු ආධාර සහිත ව්‍යාපෘති සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටීන් පිළිබඳ පුහුණු වැඩසටහන | ඉන්දියාව | 2018.02.12-23 |
| 24 | පී.කේ. ප්‍රේමකුමාර මයා සංවර්ධන නිලධාරී | සංවර්ධිත රටවල් සඳහා නිවාස සහනාධාර ලබාදීම | චීනය | 2018.11.14-24 |
| 25 | ඩබ්.ජේ.එන් ද කොස්තා මයා -සංවර්ධන නිලධාරී | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - ක්ෂේත්‍ර චාරිකාව | චීනය | 2018.04.20-25 |
| 26 | ආර්.කේ.සී.පී. ගුණවර්ධන මිය - සංවර්ධන නිලධාරී | බහු මාධ්‍ය මධ්‍යස්ථානවල මෙහෙයුම් සඳහා පුහුණු සහ අධ්‍යයන වැඩසටහන | මැලේසියාව, ජපානය | 2018.11.18-24 |

## 3.1.2 සැලසුම් සහ මෙහෙයුම් ශාඛාව

**වගකීම**

රටේ පවත්නා සංවර්ධන උපාය මාර්ගවලට හා අමාත්‍යාංශයේ ප්‍රතිපත්තිවලට අනුකූලව සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් සකස් කිරීම, අධීක්ෂණය හා ප්‍රගති සමාලෝචනය සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.

**ශාඛාව මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

- අමාත්‍යාංශය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාත්මක සැලසුම සකස් කිරීම හා අදාල අධීක්ෂණ ආයතන වෙත එය ඉදිරිපත් කිරීම
- වාර්ෂික සැලසුම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම හා අදාල ආයතන වෙත ඒ පිළිබඳව වාර්තා කිරීම
- අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනවල සැලසුම්, මෙහෙයුම් හා ප්‍රගති සමාලෝචන කටයුතු සම්බන්ධීකරණය කිරීම
- දේශීය අරමුදල් පාදක කොට ගෙන අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනා පිළිබඳ සලකා බැලීම හා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- වාර්ෂික කාර්යසාධන වාර්තාව හා අයවැය විවාදය වෙනුවෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍යාංශයේ ප්‍රගති වාර්තාව සකස් කිරීම
- තිරසර සංවර්ධන අභිමතාර්ථ ළඟා කරගැනීම පිළිබඳව අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- දේශගුණ විපර්යාස අවම කිරීම හා සම්බන්ධව අදාල ආයතන සමග අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම
- තොරතුරු පනතට අදාලව කරනු ලබන කටයුතු
- ජාතික පර්යේෂණ හා සංවර්ධන සමීක්ෂණය සිදු කිරීම
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සිදුකෙරෙමින් පවතින ව්‍යාපෘතිවල තොරතුරු රැස්කිරීම හා යාවත්කාලීන කිරීම
- අමාත්‍යාංශය යටතේ දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන වැඩසටහන්/ව්‍යාපෘතිවල තොරතුරු රැස් කිරීම හා යාවත්කාලීන කිරීම

### 2018.12.31 දිනට ප්‍රගතිය

- 2018 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලසුම සකස් කිරීම හා අදාළ ආයතන වෙත නියමිත කාලවකවානු තුළ ඉදිරිපත් කිරීම
- පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා "වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2017" සකස් කිරීම
- 2018 හා 2019 වර්ෂවල දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත විවිධ සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා 116ක් සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉදිරිපත් කළ ව්‍යාපෘති යෝජනා 14ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
- අමාත්‍යාංශය හා ඊට අනුබද්ධ ආයතන, ව්‍යාපෘති මගින් සිදුකරන ලද සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් 13ක් පැවැත්වීම
- අමාත්‍යාංශයේ වාර්ෂික සැලසුම ක්‍රියාත්මක කිරීම සම්බන්ධ භෞතික හා මූල්‍ය ප්‍රගතිය (කාර්තුමය වශයෙන්) ජනාධිපති ලේකම් කාර්යාලය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ "වාර්ෂික වාර්තාව - 2017" සහ "අර්ධ වාර්ෂික වාර්තාව - 2018" හි ඇතුලත් කිරීම සඳහා මෙම අමාත්‍යාංශයට අදාල තොරතුරු ශ්‍රී ලංකා මහබැංකුව වෙත ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශයට අදාලව "ජාතික පර්යේෂණ සහ සංවර්ධන සමීක්ෂණය - 2017" සිදු කර ජාතික විද්‍යා පදනම වෙත ඉදිරිපත් කිරීම

- අයවැය ඇස්තමේන්තුව - 2019 සකස් කිරීම සඳහා තිරසර සංවර්ධන අභිමතාර්ථ ළඟා කරගැනීම පිණිස අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ව්‍යාපෘතිවල දායකත්වය පිළිබඳ දත්ත හා තොරතුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

- "රාජ්‍ය ආයෝජන වැඩසටහන - 2018/2021"ට අදාලව අමාත්‍යාංශයේ වැඩසටහන්/ව්‍යාපෘති ඇතුළත් වාර්තාව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම

- ජාතික වශයෙන් නිර්ණය කරන ලද දායකත්ව පිළිබඳ සමාලෝචනය සඳහා නාගරික සැලසුම් සහ මානව ජනාවාස අංශයෙහි ප්‍රගතිය මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය වෙත යොමු කිරීම

- දේශගුණ විපර්යාස අවම කිරීම සඳහා දායකත්වයක් දක්වන ව්‍යාපෘති යෝජනා 03ක් (ප්‍රවාහන අංශය සම්බන්ධ) මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම

- දේශගුණ විපර්යාස කෙරෙහි සෘජු බලපෑම් දක්වන මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්/ව්‍යාපෘතිවල ප්‍රගතිය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම

- තිරසර සංවර්ධන අභිමතාර්ථවලට අදාලව සිදු කර ඇති ව්‍යාපෘතිවල ප්‍රගතිය හා ආරම්භ කිරීමට අපේක්ෂිත ව්‍යාපෘතිවල තොරතුරු තිරසර සංවර්ධන හා වන ජීවී අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම

- රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සිදු කෙරෙමින් පවතින ව්‍යාපෘති සම්බන්ධ තොරතුරු රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

- විමසා සිටි අවස්ථාවන්හි දී අමාත්‍යාංශය මගින් දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු අදාල දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත යොමු කිරීම

## 3.2 ගිණුම් අංශය

**වගකීම**

අමාත්‍යාංශය සඳහා අයවැය ඇස්තමේන්තුව මගින් වෙන්වී ඇති ප්‍රතිපාදන සීමාව තුළ අදාල වියදම් දැරීම, ප්‍රගති සමාලෝචනය, මූල්‍ය තත්වය පිළිබඳ ගිණුම් පිළියෙල කිරීම හා විගණනයට ඉදිරිපත් කිරීම.

**අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

- අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල හා විදේශ ව්‍යාපෘති සම්බන්ධව වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කර ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම හා වාර්ෂික අයවැය මගින් වෙන් වන ප්‍රතිපාදන සීමාවන් තුළ වියදම් කළමනාකරණය කර ගනිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය කරගෙන යාමට සහය ලබාදීම.

- මහා භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතු පහත සඳහන් කාලීන වාර්තා අදාල කාල සීමාවන්ට අනුව ඉදිරිපත් කිරීම.

| වාර්තාව | කාල රාමුව |
|---|---|
| වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම | අදාළ වර්ෂය ආරම්භයේ දී |
| වාර්ෂික අක්මුදල් පත්‍රය | වර්ෂයේ වැඩ කරන පළමු දිනයේ දී |
| වාර්ෂික අක්මුදල් සැලැස්ම | වර්ෂය ආරම්භයේ දී |
| වාර්ෂික අයවැය | චක්‍රලේඛ පරිදි ඉදිරිපත් කිරීම |
| බැංකු ගිණුම් පිළිබඳ අදාල මාසික වාර්තාව | අදාල මස වාර්තාව ඊළඟ මස 15වන දිනට පෙර |
| තැන්පත් ගිණුම් පිළිබඳ කාර්තුමය වාර්තා | අදාළ කාර්තුව අවසන් වී ඊළඟ මස 15 වන දිනට පෙර |
| කාර්තුමය අක්මුදල් සැසඳුම් වාර්තා | අදාළ කාර්තුව අවසන් වී ඊළඟ මස 15 වන දිනට පෙර |
| වාර්ෂික අක්මුදල් ඉල්ලුම් පත්‍රය | සෑම මසකම වැඩ කරන පළමු දින |
| මාසික ගිණුම් සාරාංශ | අදාළ මාසයේ ගිණුම් වාර්තා ඊළඟ මස පස් වන දිනට හෝ ඊට පෙර |

- විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා
  - වාර්ෂික ගිණුම් වාර්තා - අදාළ වර්ෂයේ ගිණුම් වාර්තා ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර
  - රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම - අදාළ වර්ෂයේ ගිණුම් වාර්තා ඊළඟ වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර
- භාණ්ඩාගාරය සමග සම්බන්ධීකරණය කරමින් විදේශ ව්‍යාපෘති සඳහා හා අනිකුත් සංවර්ධන ව්‍යාපෘති සඳහා අක්මුදල් ලබා ගැනීම හා එම මුදල් ව්‍යාපෘති අතර බෙදා හැරීම
- විදේශ ව්‍යාපෘතිවල ගෙවීම්වලට අදාල ඉල්ලුම් පත්‍ර භාණ්ඩාගාරය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම
- මූල්‍ය කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම, මුදල් රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ හා නියෝගවලට අනුකූලව අදාල ගෙවීම් හා ලැබීම් ගිණුම්ගත කිරීම හා භාණ්ඩාගාරයට වාර්තා කිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා විදේශ ව්‍යාපෘතිවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම හා අදාල වාර්තා විගණකාධිපති හා අනෙකුත් ආයතන වෙත ලබාදීම
- කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත අදාල වාර්තා සැපයීම හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලින් යැවිය යුතු වාර්තාවල ප්‍රගතිය තහවුරු කර ගැනීම
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු
- විගණන විමසුම් සඳහා අදාල අංශ සමග සම්බන්ධීකරණය කරමින් විගණකාධිපති වෙත පිළිතුරු සැපයීම

**2018.12.31 දිනට ප්‍රගතිය**

ශීර්ෂ අංකය : 162
අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම්
කාණ්ඩය - පුද්ගල පඩිනඩි හා වෙනත් පුනරාවර්තන වියදම්

**(රු.මිලියන)**

| විස්තරය | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය % |
|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | | | |
| පුද්ගල පඩිනඩි | 13.25 | 11.28 | 85% |
| අනිකුත් පුනරාවර්ථන වියදම් | 25.75 | 23.32 | 91% |
| **එකතුව** | **39.00** | **34.60** | **89%** |
| ආයතන හා පරිපාලන සේවා | | | |
| පුද්ගල පඩිනඩි | 89.50 | 86.56 | 97% |
| අනිකුත් පුනරාවර්ථන වියදම් | 780.69 | 583.88 | 75% |
| **එකතුව** | **870.19** | **670.44** | **77%** |
| **මුළු එකතුව** | **909.19** | **705.04** | **78%** |

**ප්‍රාග්ධන වියදම් (පුනරුත්ථාපනය හා අත්පත් කර ගැනීම්)**

**(රු.මිලියන)**

| විස්තරය | ප්‍රතිපාදන | මුළු වියදම | ප්‍රතිශතය (%) |
|---|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | | | |
| පුනරුත්ථාපනය | 1.60 | 0.97 | 61% |
| අත්පත් කර ගැනීම් | 1.70 | 1.18 | 69% |
| එකතුව | 3.30 | 2.15 | 65% |
| **ආයතන හා පරිපාලන සේවා** | | | |
| පුනරුත්තථාපනය | 1.80 | 1.22 | 68% |
| අත්පත් කර ගැනීම් | 3.90 | 3.56 | 91% |
| හැකියා වර්ධනය | 1.06 | 1.06 | 100% |
| **එකතුව** | **6.76** | **5.84** | **86%** |
| **මුළු එකතුව** | **10.06** | **7.99** | **79 %** |

**නාගරික යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රාග්ධන වියදම**

(රු.මිලියන)

| විස්තරය | | ප්‍රතිපාදන | වියදම | අතැති බිල්පත් | 2018 වසර අවසානයේ පැවති දේශපාලන අර්බුදය හේතුවෙන් ලබා කර ගත නොහැකි වූ මූල්‍ය වටිනාකම | එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| **එකතුව** | | **60,162.85** | **31,408.29** | **13,322.83** | **3,127.00** | **47,858.12** | **80%** |
| නාගරික සංවර්ධන අධිකාරිය | | 1,519.00 | 636.00 | 834.54 | - | 1,470.54 | 97% |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | | 2,873.00 | 1,030.88 | 1,432.56 | - | 2,463.44 | 86% |
| හම්බන්තොට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ මධ්‍යස්ථානය | | 33.80 | 33.79 | - | - | 33.79 | 100% |
| මහ කොළඹ නගර සංවර්ධන ව්‍යාපෘතිය | ලෝක බැංකුව | 5,890.00 | 2,693.03 | - | 783.00 | 3,476.03 | 59% |
| | ශ්‍රී ලංකා රජය | 1,266.00 | 1,200.36 | - | - | 1,200.36 | 95% |
| කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (3K) | | 616.50 | 612.00 | - | - | 612.00 | 99% |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (ගාල්ල හා මහනුවර) | ලෝක බැංකුව | 3,100.00 | 1,976.88 | - | - | 1,976.88 | 64% |
| | ශ්‍රී ලංකා රජය | 480.00 | 465.66 | - | - | 465.66 | 97% |
| මහ කොළඹ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | | 4,908.20 | 3,523.77 | - | - | 3,523.77 | 72% |
| මැනිං වෙළඳ, පොළ ප්‍රතිස්ථාපනය - පැලියගොඩ | | 1,510.00 | 1,508.32 | - | - | 1,508.32 | 100% |
| නගර සංවර්ධන උපාංග හා නාගරික ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | | 600.00 | 600.00 | - | - | 600.00 | 100% |
| යෝජිත බස්නාහිර කලාපීය මහානගර අධිකාරි ව්‍යාපෘති කාර්යාල ස්ථාපනය කිරීම | | 384.00 | 297.03 | - | - | 297.02 | 77% |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (අනුරාධපුර) - ශ්‍රී ලංකා රජය | | 45.00 | 41.60 | - | - | 41.60 | 92% |
| වරාය නගර ව්‍යාපෘතිය | | 3,335.00 | 3,255.13 | - | - | 3,255.13 | 98% |
| ත්‍රිකුණාමල දිස්ත්‍රික් ප්‍රධාන සැලැසුම පිළියෙල කිරීම | | 80.35 | 80.24 | - | - | 80.24 | 100% |
| පළාත් 9 තුළ නගර සංවර්ධන ව්‍යාපෘති (සුඛිත පුරවර) | | 5,765.00 | 4,128.38 | - | - | 4,128.38 | 72% |
| සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය | ජයිකා | 2,080.00 | - | - | 2,080.00 | 2,080.00 | 100% |
| | ශ්‍රී ලංකා රජය | 135.00 | 95.27 | - | - | 95.27 | 71% |
| නාගරික පුනර්ජනනීය ව්‍යාපෘතිය | | 17,100.00 | 6,014.92 | 11,055.73 | - | 17,070.65 | 100% |

| විස්තරය | ප්‍රතිපාදන | වියදම | අතැති බිල්පත් | 2018 වසර අවසානයේ පැවති දේශපාලන අර්බුදය හේතුවෙන් ලබා කර ගත නොහැකි වූ මූල්‍ය වටිනාකම | එකතුව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|
| පොදු ප්‍රවාහන සේවය ප්‍රවර්ධනය කිරීම සඳහා බස් සේවා වැඩිදියුණු කිරීම | 1,100.00 | 592.67 | - | - | 592.67 | 54% |
| හෝමාගම ප්‍රදේශයේ මාර්ග පහසුකම් වැඩිදියුණු කිරීම (තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය) | 100.00 | 48.39 | - | 264.00 | 312.39 | 312% |
| වේරස් ගඟ අපජල බැහැර කිරීම හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | 1,873.00 | 1,277.37 | - | - | 1,277.37 | 68% |
| සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම හරිත උද්‍යානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 500.00 | 345.42 | - | - | 345.42 | 69% |
| පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය | 16.00 | 10.16 | - | - | 10.16 | 64% |
| **අවම මූල්‍ය ප්‍රගතියක් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර** | | | | | | |
| මහ කොළඹ සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය - විදේශ ප්‍රදාන | 110.00 | 10.18 | ආසියානු යටිතල පහසුකම් දියුණු කිරීමේ ආයෝජන බැංකුව (AIIB) විසින් ප්‍රදානය කරන ලද ආධාර මුදල අතර මගදී අවලංගු කිරීම | | | |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (යාපනය) - ලෝක බැංකුව | 1,000.00 | 243.50 | AB 31 සහ AB 21 මාර්ගවලට අදාලව ඉඩම් අත්පත් කර ගැනීමේ හා නිරවුල් කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම | | | |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (යාපනය) - ශ්‍රී ලංකා රජය | 350.00 | 73.90 | | | | |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (අනුරාධපුර) - ලෝක බැංකුව | 300.00 | 82.14 | ව්‍යාපෘතියේ සැලසුම් කටයුතු සඳහා තෝරාගත් උපදේශක ආයතනය විසින් කළ යුතු සවිස්තර සැලසුම් නිර්මාණය සහ ඊට අදාල ලංසු කැඳවීමේ දී සිදු වූ ප්‍රමාදය | | | |
| බේරේ වැව පුනරුත්ථාපන හා ප්‍රතිසංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 450.00 | 88.03 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටි පදිංචිකරුවන් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නව නිවාස ඉදිකිරීමේ කටයුතු අවසන් කළ යුතු වීම | | | |
| බෝගම්බර බන්ධනාගාර භූමිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 200.00 | 70.39 | පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පූර්ණ අධීක්ෂණය මත සිදු කළ ව්‍යාපෘතියක් බැවින් අවශ්‍ය අනුමැති ලබා ගැනීමට සිදු වීම හා අදාල භූමියේ පවත්වාගෙන ගිය තාවකාලික බස් නැවතුම්පොළ ඉවත් කිරීමට කල් ගතවීම | | | |
| කාක දූපත ව්‍යාපෘතිය | 150.00 | 0.06 | ඉඩමේ නිරවුල් අයිතිය සනාථ කිරීමට නොහැකි වීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු නතර කිරීම | | | |
| කලුපාලම පොම්පාගාර ව්‍යාපෘතිය | 400.00 | - | මෙම ව්‍යාපෘතිය කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ සිදු වන හෙයින් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් මෙම ව්‍යාපෘතිය අවලංගු කිරීම | | | |
| නිල්වලා ව්‍යාපෘතිය | 690.00 | 130.59 | වාස්තු විද්‍යාත්මක උපදේශන සේවා සිදු කළ පෞද්ගලික ආයතනය ඒවා ඉටු කිරීමට පමා වීම හා ඉඩම් ගොඩකිරීමට අවශ්‍ය පාරිසරික අනුමැති ලබා දීමේ දී සිදු වූ පමාව | | | |

| අවම මූල්‍ය ප්‍රගතියක් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| මහානගර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ඉඩම් අත්කර ගැනීම | 400.00 | 0.86 | **සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය -**<br>දේශපාලන අර්බුදය හේතුවෙන් ශක්‍යතා අධ්‍යයනය සඳහා වන ගිවිසුම අත්සන් කිරීමට නොහැකි වීම<br>**ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය -**<br>ඉඩම් අත්පත් කර ගැනීමේ හා නිරවුල් කර ගැනීමේ ක්‍රියාවලිය අවසන් නොවීම<br>**ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය -**<br>***සැහැල්ලු දුම්රිය ප්‍රවාහන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය***<br>මේ සඳහා තෝරාගත් දුම්රිය මාර්ගය වූ කි.මී. 52ක අධ්‍යයන ප්‍රදේශය කි.මී. 84 ක් දක්වා දීර්ඝ කිරීමට සිදුවීම නිසා මෙම කාර්යය 2019 මැයි මස දක්වා දීර්ඝ වීම<br>***පොල්දුව අතුරු මාර්ගය ඉදිකිරීම (රු.මි. 583.6)***<br>රාජ්‍ය ආයතන දෙකක් අතර වන ගිවිසුමක් වුවත් බැඳුම් කරයක් අවශ්‍ය බව තීරණය වීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අවශ්‍ය විය. දේශපාලන අර්බුද සමයේ අධ්‍යක්ෂ මණ්ඩලය අක්‍රිය වීම හේතුවෙන් කටයුතු පමා විය |
| නූතන තිරසාර නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම | 783.00 | 241.22 | කැබිනට් තීරණය අනුව ව්‍යාපෘති සඳහා රජයේ ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කළ බැවින් කොන්ත්‍රාත් ප්‍රදානය පමා වීම. එසේම, අලුතෙන් පත් වූ ප්‍රාදේශීය සභා/නගර සභා යටතේ නැවත අනුමැතිය ලබා ගැනීමට සිදුවීම හා ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු පමා වීම |
| නාගරික ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීමේ ව්‍යාපෘතිය | 20.00 | 0.16 | ආසියානු සංවර්ධන බැංකුව සමග ගිවිසුම අත්සන් කිරීමට ප්‍රමාද වීම |

## 3.3 නාගරික සංවර්ධන අංශය

නාගරික සංවර්ධන සහ ඉඩම් යන ශාඛා මෙම අංශය යටතේ පවතී.

### 3.3.1 නාගරික සංවර්ධන ශාඛාව

**ශාඛාවේ වගකීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ විෂයපථයට අයත් වන නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් ව්‍යාපෘති මගින් සිදු කරනු ලබන නාගරික සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණ ගැනීම, නීත්‍යානුකූල අනුමැතිය ලබාදීම, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය

**ශාඛාවේ මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

- සුඛිත පුරවර නගර සංවර්ධන වැඩසටහන යටතේ විවෘත ලංසුකරුවන් වෙත ප්‍රදානය කරනු ලබන විවිධ ව්‍යාපෘතිවලට අදාලව තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම, රාජ්‍ය උපදේශන ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන ලංසු කැඳවීමට අදාල ලේඛන පරීක්ෂා කිරීම, ලංසු කැඳවීම, ලංසු විවෘත කිරීමට පෙර ලංසුකරුවන් දැනුවත් කිරීමේ රැස්වීම් කැඳවීම, ලංසු විවෘත කිරීම, ඇගයීම හා ප්‍රදානය, ප්‍රගති සමාලෝචනය, උපදේශන ආයතන මගින් අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබන බිල්පත් පරීක්ෂා කර මුදල් ගෙවීමට අදාල සහතික පත්‍ර සකස් කර අදාල කොන්ත්‍රාත්කරු සඳහා ගෙවීම් කිරීම පිණිස ගිණුම් අංශය වෙත යොමු කිරීම හා අවශ්‍ය අවස්ථාවල දී ව්‍යාපෘති සඳහා සම්බන්ධ සියලු පාර්ශව කැඳවා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- සුඛිත පුරවර නගර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ආයතන වෙත ප්‍රදානය කරනු ලබන අවිච්ඡේද ව්‍යාපෘතිවලට අදාලව රාජ්‍ය උපදේශන ආයතන විසින් ඉදිරිපත් කරනු ලබන වියදම් ඇස්තමේන්තු පරීක්ෂා කර ව්‍යාපෘති අදාල රාජ්‍ය ආයතන වෙත ප්‍රදානය කිරීම හා උපදේශන ආයතන මගින් අමාත්‍යාංශය වෙත යොමු කරනු ලබන බිල්පත් පරීක්ෂා කර මුදල් ගෙවීමට අදාල සහතික පත්‍ර සකස්කර අදාල කොන්ත්‍රාත්කරු සඳහා ගෙවීම් කිරීම පිණිස ගිණුම් අංශය වෙත යොමු කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී ව්‍යාපෘති සඳහා සම්බන්ධ සියලු පාර්ශව කැඳවා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම

- නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන කාර්යයන්ට අදාලවන හා අමාත්‍යාංශය යටතේ පවතින විවිධ සංවර්ධන ව්‍යාපෘතිවලට අදාලවන අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධ කටයුතු සිදු කිරීම
- නාගරික සංවර්ධන බල ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීම, නාගරික සංවර්ධන සැලසුම් ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධ කාර්යයන් අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ඇගයීම
- නාගරික සංවර්ධන අධිකාරියට අදාල වන මහජන පැමිණිලි, පෞද්ගලික හා රාජ්‍ය ආයතනවලින් ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම
- අනවසර ඉදිකිරීම් හා අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමට අදාල කටයුතු අධීක්ෂණය, සම්බන්ධීකරණය හා ඇගයීම
- ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය හා වෙනත් රාජ්‍ය ආයතන මගින් සංවර්ධන කාර්යයන්ට අදාලව අමාත්‍යාංශය වෙතින් විමසන කාරණාවන් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකිරීම

**2018.12.31 දිනට ප්‍රගතිය**

- අයවැය - 2018 මගින් වැය විස්තර 9ක් යටතේ වෙන්කර ඇති මුදල් ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් සුබිත පුරවර නගර සංවර්ධන වැඩසටහන යටතේ අවිච්ජේද සංවර්ධන ව්‍යාපෘති 122ක් සහ රාජ්‍ය ආයතන 7ක උපදේශකත්වය මත විවෘත ලංසු කැඳවීම යටතේ දිවයින පුරා නව සංවර්ධන ව්‍යාපෘති 55ක් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම හා ඇගයීම
- නාගරික සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් බැහැර කිරීම සම්බන්ධයෙන් වන පනත්, නීති රීති, රෙගුලාසිවලට අනුකූලව අදාල බැහැර කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- නාගරික සංවර්ධන අධිකාරිය මගින් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවලට හා එම ව්‍යාපෘතිවලට අදාල ඉඩම් බැහැර කිරීම/බදුදීම සඳහා වන අමාත්‍ය මණ්ඩල සංදේශ අධීක්ෂණය, අනුමැතිය සඳහා යොමු කිරීම හා අමාත්‍ය මණ්ඩල තීරණ සම්බන්ධයෙන් අදාල පසුවිපරම් කිරීම
- ඉඩම් බැහැර කිරීම/බදු දීමට අදාළව 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 18.1 වගන්තිය යටතේ වන සහතිකය සඳහා ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම හා එම තීරණවලට අදාල කටයුතු කිරීම
- ඉඩම් ආඥා පනත (නැවත පවරා ගැනීම) යටතේ නාගරික සංවර්ධන අධිකාරියට අයත් දේපලවල අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම හා අදාල දේපල නැවත පවරා ගැනීමට අදාලව 1979 අංක 7 දරණ රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ලබන 14 (2) බී වගන්තිය යටතේ වන සහතිකය පරීක්ෂා කිරීම, සකස් කිරීම හා රජයේ ඉඩම් සන්තකය ආපසු ලබා ගැනීමේ පනත යටතේ ඉදිරිපත් කරනු ලබන ලබන 14 (2) බී වගන්තිය යටතේ වන සහතිකය ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා යොමු කිරීම හා එම තීරණවලට අදාල කටයුතු කිරීම
- නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික බල ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කිරීම සම්බන්ධව සම්බන්ධීකරණ කටයුතු කිරීම
- වාණිජමය ව්‍යාපෘති, කර්මාන්ත ව්‍යාපෘති, ආයෝජන මණ්ඩල ව්‍යාපෘති, නගර සංවර්ධන සැලසුම් ව්‍යාපෘති රාජ්‍ය ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල, පුණ්‍යායතන හා සමාජ සේවා ආයතන සඳහා ඉඩම් බදුදීම් අදාළ ලිපි ලේඛන පරීක්ෂා කිරීම හා නාගරික සංවර්ධන අධිකාරිය සතු නිවාස යෝජනාක්‍රම හා වෙළඳ සංකීර්ණ ඒකක බැහැර කිරීම සම්බන්ධ කටයුතු කිරීම
- ඉඩම් බැහැර කිරීම්වලට අදාලව ජනාධිපති කාර්යාලය, අගමැති කාර්යාලය, අමාත්‍යාංශ හා වෙනත් ආයතන මගින් යොමු කරන ලද ලිපි සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කිරීම
- පහත සඳහන් ව්‍යාපෘතිවල අමාත්‍ය මණ්ඩල පත්‍රිකා හා අනෙකුත් අනුමැති සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි අධීක්ෂණය කිරීම හා අදාල සංශෝධන සිදු කිරීමෙන් අනතුරුව ගරු විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම
    - වරාය නගර ව්‍යාපෘතිය
    - උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
    - මහ කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
    - ත්‍රිකුණාමල ප්‍රධාන සැලැස්ම සකස් කිරීම
    - ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
    - වේරස් ගඟ ව්‍යාපෘතිය
    - නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය

## 3.3.2 ඉඩම් ශාඛාව

**වගකීම**

අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු, ආයතන හා ව්‍යාපෘති මගින් සිදු කරනු ලබන සියලුම පොදු සංවර්ධන කටයුතු සඳහා එම ආයතනවල අවශ්‍යතාව අනුව ඉඩම් අත්කර ගැනීම හා රජයේ ඉඩම් පවරා ගැනීම සම්බන්ධයෙන් සහාය වීම හා අමාත්‍යාංශය වෙනුවෙන් ආයතන අතර සම්බන්ධීකරණය සිදු කිරීම.

**ශාඛාව මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති මගින් ඉටුකරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් අත්කර ගැනීම, පවරා ගැනීම, ඉඩම් අවසතු කිරීම හා ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙනුවෙන් සම්බන්ධීකරණ කාර්යය හා එයට අදාළ අනෙකුත් කාර්යයන් සිදු කිරීම.

**2018.12.31 දිනට ප්‍රගතිය**

අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ව්‍යාපෘතිවලින් ලැබෙන ඉල්ලීම පරිදි පහත දැක්වෙන ව්‍යාපෘතීන්ට අදාළව ඉහත සඳහන් කාර්යයන් සිදු කර ඇත.

- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය
- කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය
- උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය තාක්ෂණික නගර ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය ගුවන් නගර ව්‍යාපෘතිය
- බස්නාහිර කලාපීය පරිපාලන නගර ව්‍යාපෘතිය
- ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
- සුබිත පුරවර වැඩසටහන
- පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය
- විසල් හම්බන්තොට ව්‍යාපෘතිය
- විසල් මහනුවර ව්‍යාපෘතිය
- පේරාදෙනිය නගර සංවර්ධන ව්‍යාපෘතිය
- දඹුල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය
- අනුරාධපුර පූජා නගර සංවර්ධන ව්‍යාපෘතිය
- සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘතිය - ජයිකා
- කොළොන්නාව වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

## 3.4 මහානගර අංශය

**වගකීම**

ප්‍රතිපත්ති සැකසීම, උපායමාර්ග හඳුනා ගැනීම සහ මහානගර මූලාරම්භය හා සම්බන්ධ ව්‍යාපෘති අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ප්‍රගති සමාලෝචනය

**අංශය මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්**

- බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති හා සංවර්ධන කටයුතු සම්බන්ධීකරණය, අධීක්ෂණය හා ඇගයීම
- මහානගර මූලාරම්භයන් හා සැලසුම් සම්බන්ධව වෘත්තීයවේදීන් ඇතුළු විවිධ ආයතන හා සමාජ කණ්ඩායම් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ අදහස් ලබා ගැනීම, එම අදහස් උපයෝගී කරගෙන ප්‍රතිපත්ති සැකසීම හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගැනීම
- මහානගර සංවර්ධනයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයෝජන සපයා ගැනීම අරමුණු කර ගනිමින් විවිධ ජාත්‍යන්තර ආයතන හා තානාපති කාර්යාල සමග සම්බන්ධීකරණය
- මහානගර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අරමුණු කර ගත් අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සම්බන්ධයෙන් වූ කාර්යයන් සම්බන්ධීකරණය
- අමාත්‍යාංශයේ විෂය පථයට අයත් විවිධ ජාත්‍යන්තර දින සැමරීම අරමුණු කර ගත් වැඩසටහන් හා වෙනත් දේශීය වැඩසටහන් අමාත්‍යාංශය යටතේ වූ ආයතන හා සම්බන්ධ වී සංවිධානය කිරීම

- ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුතුව අමාත්‍යාංශයේ සතිපතා පවත්වන ප්‍රගති සමාලෝචන රැස්වීම සම්බන්ධීකරණය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ සංවර්ධන කටයුතු ව්‍යාපෘති හා ඉඩම් සම්බන්ධ කටයුතු අධීක්ෂණය හා සම්බන්ධීකරණය
- මහානගර ව්‍යාපෘති හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අදාළ මහජන පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියා කිරීම
- මහානගර ව්‍යාපෘති, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට අදාළ කැබිනට් පත්‍රිකා සැකසීම හා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම
- මහානගර ව්‍යාපෘතිවලට අදාළව පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැකසීම සම්බන්ධීකරණය
- මහානගර ව්‍යාපෘතිවලට අදාල මෙහෙයුම් කමිටු හා ව්‍යාපෘති ඇගයීම් කමිටු සංවිධානය හා සම්බන්ධීකරණය
- කුඩා නගරවල යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ සුබිත පුරවර වැඩසටහන හා සිහිලැල් දැහැන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- කොළඹ, කළුතර හා ගම්පහ යන දිස්ත්‍රික්කවලට අදාල විමධ්‍යගත අයවැය වැඩසටහන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය හා අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සමග සම්බන්ධීකරණය
- මහානගර ව්‍යාපෘතිවලට අදාල ක්‍රියාකාරී සැලසුම් සැකසීම හා එහි ප්‍රගති සමාලෝචනය

## 2018.12.31 දිනට ප්‍රගතිය

- **ජාත්‍යන්තර සහයෝගීතාව, වෙළඳපොළ ස්ථාපිත කිරීම සහ ප්‍රවර්ධනය, ආයෝජන ආරක්ෂණය**

මහානගර ප්‍රධාන සැලසුම යටතේ හඳුනා ගන්නා ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයෝජන ආරක්ෂණය සඳහා විදේශීය දූත ගමන්, රැස්වීම් සහ සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් ගනු ලැබ ඇත. එමෙන්ම තාක්ෂණික සහයෝගිතා ප්‍රවර්ධනය, තාක්ෂණ හා ආයෝජන හවුල්කරුවන් හඳුනා ගැනීම සහ ඍජු විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍යයන් අතර (G to G) මෙන්ම රාජ්‍ය හා ව්‍යාපාරික ආයතන සමගත් (G to B) සබඳතා ශක්තිමත් කිරීම සඳහා විභවතා සහිත හවුල්කාර රටවල් කිහිපයක සංචාරය කිරීමට අමාත්‍යාංශ නිලධාරීන්ට අවස්ථාව ලැබී ඇත. ද්විපාර්ශවීය/බහුපාර්ශවීය සාකච්ඡා, අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම් හා එකඟතා, ව්‍යාපාරික සමුළු සහ මහානගර ක්‍රියාකාරකම් ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම ද මෙයට ඇතුලත්ය.

**ද්විපාර්ශවික සාකච්ඡා, වැඩමුළු හා අවබෝධතා ගිවිසුම් - 2018**

| # | කාර්යය | දිනය |
|---|---|---|
| 1 | යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වන ආයෝජන හැකියාවන් සොයා බැලීම සඳහා වූ සිංගප්පූරු ව්‍යාපාරික දූත පිරිසක් හා අමාත්‍යාංශ නිලධාරීන් අතර වූ ද්විපාර්ශවීය හමුව | 2018.01.25 |
| 2 | ඉඩම් සංවර්ධන හා දේපල වෙළඳාම පිළිබඳ ජපාන ආයෝජකයන් සඳහා පවත්වන ලද වැඩසටහන | 2018.02.16 |
| 3 | මහානගර සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ආයෝජකයන් ආකර්ෂණය කරගැනීමේ අරමුණින් යුරෝපීය වාණිජ මණ්ඩලය හා අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම | 2018.03.09 |
| 4 | රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව ආයෝජන අවස්ථා සොයා බැලීම පිණිස මහාචාර්ය කිම්යූංගේ ප්‍රධානත්වයෙන් යුත් කොරියානු දූත පිරිසේ ශ්‍රී ලංකා සංචාරය | 2018.07.02 |
| 5 | සැහැල්ලු දුම්රිය ගමනාගමන ආයෝජන අවස්ථා පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා චීන දූත පිරිසේ සංචාරය | 2018.07.31 |
| 6 | චීනයේ බීජිං නගරයේ පැවති “ශ්‍රී ලංකා ආර්ථික සහ ආයෝජන සාකච්ඡා සභාව - 2018” | 2018.09.18 - 20 |
| 7 | ශ්‍රී ලංකා කුවේට් දෙවන ඒකාබද්ධ අමාත්‍ය කමිටු සම්මේලනයේ දී කුවේට් රාජ්‍යයේ වාණිජ මණ්ඩලය හා ආයෝජන ප්‍රවර්ධන අධිකාරිය සමග සාකච්ඡා පැවැත්වීම | 2018.10.09 - 11 |
| 8 | ඇමරිකා එක්සත් ජනපදයේ පැවති සහස්‍ර අභියෝග ආයතනයේ ඒකාබද්ධ කතිකාව සඳහා ශ්‍රී ලංකාවේ නියෝජිත කණ්ඩායම සමග සහභාගී වීම | 2018.10.01 - 5 |

- **''සිහිලැල් දැහැන වැඩසටහන''**

  අධ්‍යාත්මික සංවර්ධනය තුළින් පුද්ගල සංතුෂ්ටිය වර්ධනය කිරීම අරමුණු කර ගනිමින් ආරම්භ කරන ලද මෙම වැඩසටහන කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක කරන ලද අතර ඒ යටතේ රු.මි. 58.3ක වටිනාකමකින් යුත් ව්‍යාපෘති 32ක් නිමකර ඇත.

- **''සුඛිත පුරවර'' කුඩා නගර සංවර්ධන වැඩසටහන**

  නාගරික සංවර්ධන අධිකාරිය මගින් සකස් කරනු ලබන ''සුඛිත පුරවර'' ප්‍රධාන වැඩසටහනට සමගාමීව බස්නාහිර, උතුරු මැද, මධ්‍යම, දකුණ, නැගෙනහිර, සබරගමුව, වයඹ හා ඌව යන පළාත්වල ප්‍රධාන නගර හා සම්බන්ධ තදාසන්න නගරවල මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන ආරම්භ කර ඇති අතර මේ යටතේ රු.මි. 722.55 යුත් ව්‍යාපෘති 1,048ක් නිම කර ඇත.

- **විමධ්‍යගත අයවැය වැඩසටහන (DCB)**

  කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්කවල ආර්ථික, සමාජීය, සංස්කෘතික හා ආගමික අභිවෘද්ධිය සහතික කරනු පිණිස මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. බස්නාහිර පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ (ජාතික ලැයිස්තු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැර) ව්‍යාපෘති යෝජනා නිර්දේශ කර ඉදිරිපත් කිරීමෙන් පසු ඒවා අනුමත කිරීම මෙම අමාත්‍යාංශය මගින් සිදු කරනු ලැබේ. මේ යටතේ 2018 වසර සඳහා අනුමත කළ වැඩසටහන් සංඛ්‍යාව 2,23කි.

- **ප්‍රගති සමාලෝචනය**

  ගරු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලබන ප්‍රගති සමාලෝචන රැස්වීම් සෑම සතියකම සඳුදා දින අමාත්‍යාංශය, අනුබද්ධ ආයතන හා ව්‍යාපෘතිවල ප්‍රධානීන්ගේ සහභාගීත්වයෙන් පවත්වනු ලබන අතර එහි සම්බන්ධීකරණ කටයුතු හා ප්‍රගතිය සම්බන්ධ පසු විපරම් කටයුතු සිදු කිරීම

- මහානගර ව්‍යාපෘතිවලට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා මෙහෙයුම් කමිටු පත්කිරීම හා එම මෙහෙයුම් කමිටු සම්බන්ධීකරණය

- බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය තාක්ෂණික නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය, බස්නාහිර කලාපීය සැලසුම් ව්‍යාපෘතිය සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම

## 3.5 තාක්ෂණ අංශය

තාක්ෂණ ශාඛාව සහ තොරතුරු තාක්ෂණ ශාඛාව මෙම අංශය යටතේ පවතී.

### 3.5.1 තාක්ෂණ ශාඛාව

**වගකීම**

අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටු, අමාත්‍යාංශ මට්ටමේ උපදේශක ප්‍රසම්පාදන කමිටු හා ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු සම්බන්ධීකරණය කිරීමත්, එම කමිටුවල තීරණ පිළිබඳ වාර්තා තැබීමත්, එම කමිටු සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලංසු ලියවිලි හා අනෙකුත් ලියවිලි සුරක්ෂිතව හා ප්‍රමාදයකින් තොරව කමිටුවලට ඉදිරිපත් කිරීමත්, එහි ගන්නා තීන්දු තීරණ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා ව්‍යාපෘති හරහා ක්‍රියාවේ යෙදවීමට කටයුතු කිරීමත්, අමාත්‍ය මණ්ඩල මට්ටමේ ප්‍රසම්පාදන පිළිබඳව මහා භාණ්ඩාගාරය වෙත නිවැරදි තොරතුරු ඉදිරිපත් කරමින් අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කටයුතු වංචාවකින් හෝ දූෂණයකින් තොරව විනිවිදභාවයකින් යුතුව ක්‍රියාත්මක කිරීම.

**ශාඛාව මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන්**

- ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටු, අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු හා එම කමිටුවලට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම සඳහා මහා භාණ්ඩාගාරය සමග කටයුතු කිරීම
- ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල අමාත්‍යාංශ මට්ටමේ උපදේශක ප්‍රසම්පාදන කමිටු, ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු හා එම කමිටුවලට අදාළ තාක්ෂණික ඇගයීම් කමිටු පත්කිරීම
- ප්‍රසම්පාදන රැස්වීම් සංවිධානය කිරීම
- ප්‍රසම්පාදන තීරණ වාර්තා සැකසීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ආයතනවලට එම වාර්තා යොමු කිරීම.
- ලංසු පත්‍රිකා භාර ගැනීම සහ ලංසු විවෘත කිරීම් සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- ලංසු පත්‍රිකා සුරක්ෂිතව අදාළ ව්‍යාපෘති/ආයතන වෙත යොමු කිරීම හා ලංසු පත්‍රිකාවල පිටපත සුරක්ෂිතව ගබඩා කර ගැනීම
- ප්‍රසම්පාදන ප්‍රදානය කිරීමට පෙර ජනාධිපති කාර්යාලයේ අභියාචනා කමිටු වෙත අදාළ ලේඛන ඉදිරිපත් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු කිරීම
- ප්‍රසම්පාදන ප්‍රගතිය පිළිබඳ අදාල ව්‍යාපෘති/ආයතන සමග මාසික සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- යාවත්කාලීන කරන ලද ප්‍රසම්පාදන ප්‍රගති වාර්තා මාසිකව භාණ්ඩාගාරය වෙත යොමු කිරීම
- නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ ගෙවීම් සිදු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රතිපූර්ණ බිලපත් පරීක්ෂා කර නිර්දේශ කිරීම
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ මූලික අනුපාතික (BOQ basic rates) සමාලෝචනය කිරීම සහ අනුමැතිය සඳහා අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කිරීම

**2018.12.31 දිනට ප්‍රගතිය**

- **ප්‍රසම්පාදන කාර්යයන් සාර්ථකව සම්පූර්ණ කර ටෙන්ඩර් ප්‍රදානය කර ඇති ව්‍යාපෘති පිළිබඳ තොරතුරු**

| ව්‍යාපෘතිය/ආයතනය | | අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවට අයත් ප්‍රසම්පාදන | | අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවට අයත් ප්‍රසම්පාදන | | ව්‍යාපෘති මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවට අයත් ප්‍රසම්පාදන | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රදානය කරන ලද | දැනට ක්‍රියාත්මක වන | ප්‍රදානය කරන ලද | දැනට ක්‍රියාත්මක වන | ප්‍රදානය කරන ලද | දැනට ක්‍රියාත්මක වන |
| 1 | නාගරික සංවර්ධන අධිකාරිය | 03 | 09 | - | - | - | - |
| 2 | ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 01 | 02 | - | - | - | - |
| 3 | නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය | 03 | 07 | - | - | - | - |
| 4 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය | 02 | 01 | 02 | - | - | |
| 5 | කොළඹ අගනගරය ආශ්‍රිත නගර සංවර්ධන ව්‍යාපෘතිය | 06 | 01 | - | - | 01 | - |
| 6 | තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය | 04 | - | - | - | 11 | 02 |

| ව්‍යාපෘතිය/ආයතනය | | අමාත්‍ය මණ්ඩලය පත් කරන ලද ප්‍රසම්පාදන කමිටුවට අයත් ප්‍රසම්පාදන | | අමාත්‍යාංශ මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවට අයත් ප්‍රසම්පාදන | | ව්‍යාපෘති මට්ටමේ ප්‍රසම්පාදන කමිටුවට අයත් ප්‍රසම්පාදන | |
|---|---|---|---|---|---|---|---|
| | | ප්‍රදානය කරන ලද | දැනට ක්‍රියාත්මක වන | ප්‍රදානය කරන ලද | දැනට ක්‍රියාත්මක වන | ප්‍රදානය කරන ලද | දැනට ක්‍රියාත්මක වන |
| 7 | උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 03 | 04 | 01 | 02 | - | - |
| 8 | පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය | 02 | 01 | - | - | 03 | - |
| 9 | ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය | - | 02 | - | 01 | 05 | 01 |
| 10 | ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය | - | 02 | - | - | 03 | 05 |
| 11 | සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 01 | - | - | - | 01 | - |
| 12 | වෝටර්ස් ඒජ් | - | 02 | - | - | - | - |
| 13 | ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකය | - | - | - | - | 03 | 01 |
| 14 | බස් රථ නවීකරණය හා සහසර ව්‍යාපෘතිය | - | - | - | - | 02 | - |
| **එකතුව** | | **25** | **31** | **03** | **03** | **29** | **09** |

- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ 2018 වර්ෂය සඳහා මූලික අනුපාතික 94 ක් සමාලෝචනය කර අනුමැතිය ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- නාගරික සංවර්ධන අධිකාරියේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ මුදල් ප්‍රතිපූර්ණ බිල්පත් පරීක්ෂා කර නිර්දේශ කිරීම

## 3.5.2 තොරතුරු තාක්ෂණ ශාඛාව

**වගකීම**

අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය ත්‍රෛභාෂිකව නිසි කලට යාවත්කාලීන කිරීමත්, සියළුම අමාත්‍යාංශ නිලධාරීන්ට රාජකාරී කටයුතු සඳහා ගැටළුවලින් තොර පරිගණක සේවාවක් සැපයීමත්, සියළුම අමාත්‍යාංශ මාණ්ඩලික නිලධාරීන්ට නිල විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීමත්, අඛණ්ඩව අන්තර්ජාල පහසුකම් සැපයීමත්, තත්ත්වයෙන් උසස් පරිගණක සහ අනෙකුත් තොරතුරු තාක්ෂණ උපාංග ලබා ගැනීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් සැපයීමත් සිදු කරමින්, තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය හා අනෙකුත් රාජ්‍ය ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු කරමින් "ඉ- රාජ්‍ය" සංකල්පය පෙරදැරි කර ගත් රාජ්‍ය සේවාවක් සඳහා මග පෙන්වීම.

**ශාඛාව මගින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යන්**

- අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම
- සියළුම මාණ්ඩලික නිලධාරින්ට නිල විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම
- අන්තර්ජාල පහසුකම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහ අදාළ සම්බන්ධීකරණ කටයුතු
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණයට අදාළ දෘඩාංග සහ මෘදුකාංග ගැටළු නිරාකරණය කිරීම, ස්ථාපිත කිරීම සහ පරිශීලකයන් දැනුවත් කිරීම
- පරිගණක පද්ධති සඳහා ආරක්ෂිත මුරපද ලබාදීම සහ පරිගණක පරිශීලක ගිණුම් පාලනය කිරීම
- අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ මෙවලම් සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතුවල දී පිරිවිතර සැකසීම සහ තාක්ෂණ ඇගයුම් කමිටුවල කටයුතු කිරීම
- තොරතුරු තාක්ෂණ නියෝජිත ආයතනය හා අනෙකුත් ආයතන සමග අදාල විෂය සම්බන්ධයෙන් අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු කිරීම

**2018.12.31 දිනට ප්‍රගතිය**

- අමාත්‍යාංශ වෙබ් අඩවිය නිසි කලට යාවත්කාලීන කර ඇති අතර ත්‍රෛමාෂිකව ලබා දී ඇති තොරතුරු අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම
- සියළුම මාණ්ඩලික නිලධාරින්ට නිල විද්‍යුත් තැපැල් ලිපිනයක් ලබාදීම
- අමාත්‍යාංශය තුල පරිගණක 123ක් සඳහා අන්තර්ජාල පහසුකම් ලබාදීම

## 3.6 අභ්‍යන්තර විගණන අංශය

**වගකීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර කරා ලඟාවනු වස් අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති අනෙකුත් සියළු ආයතන හා ව්‍යාපෘති මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය සහ රජය විසින් තත්කාලීනව නිකුත් කරනු ලබන විවිධ චක්‍රලේඛ හා වෙනත් විධිවිධානයන්ට අනුකූලව කාර්යක්ෂම මෙන්ම ප්‍රශස්ථ අන්දමින් මෙහෙයවනු ලබන්නේ ද යන්න විගණනය කිරීම, විමර්ශනය කිරීම සහ අමාත්‍යාංශ ලේකම් වෙත නිසි පරිදි වාර්තා කිරීම.

**අංශය මගින් ඉටුකරනු ලබන ප්‍රධාන කාර්යයන්**

- වාර්ෂික විගණන සැලැස්ම පිළියෙල කිරීම
- කළමනාකරණ හා විගණන කමිටු කැඳවීම
- අමාත්‍යාංශයේ වාර්ෂික අභ්‍යන්තර විගණනය සිදුකිරීම
- අමාත්‍යාංශය යටතේ ඇති විදේශ ආධාර ව්‍යාපෘති සහ දේශීය ආධාර ව්‍යාපෘති විගණනය
- අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ පවතින නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම
- විගණන හා කළමනාකරණ රැස්වීම් සඳහා සහභාගී වීම

**2018.12.31 දිනට ප්‍රගතිය**

- 2018 වසරේ විගණන සැලැස්මට අනුව විගණන කටයුතු සිදුකර විගණන වාර්තා 07ක් නිකුත් කිරීම
- විගණන හා කළමනාකරණ රැස්වීම් 03ක් පැවැත්වීම හා අදාල වාර්තා ලබාදීම
- අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සඳහා සහභාගී වීම
- අරුවක්කාලු ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය හා කළුතර පොදු වෙළෙඳ සංකීර්ණ ව්‍යාපෘතියෙහි ක්ෂේත්‍ර පරීක්ෂාවල නිරත වීම
- නාගරික සංවර්ධන අධිකාරියේ වැඩබැලීමේ මානව සම්පත් තනතුර සම්බන්ධයෙන් විශේෂ විමර්ශනයක් සිදු කර වාර්තාවක් ලබාදීම

# 4 අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතන සහ දෙපාර්තමේන්තු

- **ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව**

1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත මගින් පිහිටුවන ලද නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව, 2000 අගෝස්තු 9 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් ඒකමතිකව අනුමත කළ 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධිත) පනත යටතේ, 2001 මැයි මස 21 වන දින ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ලෙස නැවත ස්ථාපිත කරන ලදී.

අධ්‍යාත්මික හා සාමාජීය ක්‍රියාකාරකම් සඳහා යටිතල පහසුකම් සැලසීමේ අරමුණින් යුතුව "ලෝලුගස්වැව - අනුරාධපුර නව නගර ව්‍යාපෘතිය" ආරම්භ කර ඇති අතර එහි ශක්‍යතා අධ්‍යයන කටයුතු අවසන් කර ඇත. යෝජිත බිම් සැලැස්ම අනුව නැගෙනහිර නුවරගම්පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හෙක්ටෙයාර 81 ක භූමි ප්‍රමාණයක් සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට නියමිතය. 2020 වන විට ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත අතර භූමියේ අයිතිය නිරවුල් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

එමෙන්ම "පිබිදෙමු පොළොන්නරුව" වැඩසටහන යටතේ සෞඛ්‍ය අංශයේ සංවර්ධනය සඳහා තෝරාගත් රෝහල් 10ක සංවර්ධන කටයුතු සිදු කර ඇත. එසේම තෝරාගත් පාසල් 08ක සංවර්ධන කටයුතු සඳහා මූලික සැලසුම් සකස් කර අවසන් කර ඇති අතර දිඹුලාගල රජමහා විහාරයේ වාහල්කඩ, නව පිරිවෙන හා ආවාස ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් උපදේශන සේවා සැපයීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

- **නාගරික සංවර්ධන අධිකාරිය**

1978 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මගින් නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබ ඇති අතර ඒකාබද්ධ සැලසුම්කරණය හා නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශවල ආර්ථික, සාමාජීය හා භෞතික සංවර්ධනය ක්‍රියාවට නැංවීම එහි ප්‍රධාන කාර්යභාරය වේ.

2018 වසරේ දී නාගරික සංවර්ධන අධිකාරිය මගින් පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී.

| විස්තරය | හඳුනාගන්නා ලද ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|
| පළාත් නවය තුළ නගර සංවර්ධන ව්‍යාපෘති | 145 |
| නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති | 19 |
| සෑම ප්‍රාදේශීය සභා කොට්ඨාසයකම හරිත උයනක් ඉදිකිරීම | 40 |
| නවීන තිරසර කේන්ද්‍රස්ථාන නිර්මාණය හා සංවර්ධනය කිරීම | 24 |
| බේරේ වැව ප්‍රතිසංස්කරණය සහ ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 01 |
| මැනිං වෙළඳපොල පැලියගොඩ ප්‍රතිස්ථාපනය කිරීම | 01 |
| නිල්වලා අවකාශය ව්‍යාපෘතිය | 01 |
| බෝගම්බර බන්ධනාගාර ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය | 01 |
| කාක දූපත වෙරළ උද්‍යාන උත්සව ශාලා ව්‍යාපෘතිය | 01 |
| **එකතුව** | **233** |

- **ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව**

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව යනු 1976 අංක 27 දරණ පනතින් ද 1982 අංක 52 දරණ පනතින් ද 2006 අංක 35 දරණ පනතින් ද සංශෝධිත, 1968 අංක 15 දරණ කොළඹ දිස්ත්‍රික් (පහත් බිම් ප්‍රදේශ) ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත යටතේ මූලික වශයෙන් පිහිටුවන ලද සංස්ථාපිත මණ්ඩලයකි.

සංස්ථාව මගින් 2018 වර්ෂය තුළ ඇළ මාර්ග, වැව් හා ඇවිදින මංතීරු නවීකරණය කිරීමේ ව්‍යාපෘති 10ක්, ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘති 10ක්, සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම, සිතියම්ගත කිරීම හා ශක්‍යතා අධ්‍යයන ව්‍යාපෘති 5ක්, තෙත්බිම් හා පහත්බිම් සංවර්ධන ව්‍යාපෘති 7ක් සිදුකර ඇත. එමෙන්ම වේරැස් ගඟ අප ජලය බැහැර කිරීම හා පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (කළුපාලම පොම්පාගාර ව්‍යාපෘතිය ආදිය) සිදුකරමින් පවතින අතර රාගම ප්‍රදේශයේ මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතියක් මෙන්ම නාරාහේන්පිට සුඛෝපභෝගී නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීමට අවශ්‍ය මූලික සැලසුම් කටයුතු ද සිදුකර ඇත.

# 5. අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති

## 5.1 විදේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- **කොළඹ අගනගරය ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (2012 - 2020)**

කොළඹ ජල ද්‍රෝණි ආශ්‍රිත පෝෂක ප්‍රදේශයේ ගංවතුර බලපෑම් අවම කිරීම හා තෝරාගත් ආදර්ශන ආයෝජන තුළින් ප්‍රාදේශීය මට්ටමේ යටිතල පහසුකම් හා සේවා පුනරුත්ථාපනය, වැඩිදියුණු කිරීම හා පවත්වාගෙන යාම සඳහා කොළඹ අගනගරය ආශ්‍රිතව පිහිටි පළාත් පාලන ආයතනවල හැකියාව ශක්තිමත් කිරීම යනාදී අරමුණු පෙරදැරිව ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතිය සඳහා ලෝක බැංකුව මගින් ණය පහසුකම් ලබාදේ.

කොළඹ ජල ද්‍රෝණියේ ජලාපවහන ධාරිතාව වැඩිදියුණු කිරීම, කුඩා ජලාපවහන පද්ධති පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම, ගංවතුර හා ජලාපවහන කළමනාකරණය සහ ධාරිතාව වැඩි කිරීම හා බේරේ වැව ආශ්‍රිත රේඛීය උද්‍යානය සහ බැද්දගාන උද්‍යානය ඉදිකිරීම මේ යටතේ සිදු කරනු ලබයි. 2012 සිට 2018 දෙසැම්බර් අවසානය වන විට සම්පූර්ණ කර ඇති ව්‍යාපෘති ගණන 18කි. එමෙන්ම, ඉදි කෙරෙමින් පවතින ව්‍යාපෘති ගණන 12ක් වන අතර අනුමැතිය අපේක්ෂිත හා සැලසුම් අදියරේ පවතින ව්‍යාපෘති ගණන පිළිවෙලින් 04 හා 02කි.

- **උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (2014 - 2021)**

ශ්‍රී ලංකාවේ උපාය මාර්ගිකව වැදගත්කමක් උසුලන නගර හඳුනාගෙන ඒවායේ තෝරාගත් නාගරික සේවා සහ පොදු නාගරික පරිශ්‍ර වැඩි දියුණු කිරීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වේ. මේ යටතේ මහනුවර, ගාල්ල, යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය, දඹුල්ල, කුරුණෑගල හා රත්නපුර යන නගර උපාය මාර්ගිකව සංවර්ධනය කිරීමට තෝරාගෙන ඇත. ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ප්‍රංශ සංවර්ධන ආයතනය මගින් මෙම සංවර්ධන ව්‍යාපෘති සඳහා මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා දෙනු ඇත. මහනුවර හා ගාල්ල උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය (2014-2021) ප්‍රථමයෙන් ආරම්භ කරන ලද අතර ඒ යටතේ ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීම, ජල සැපයුම ප්‍රවර්ධනය කිරීම, අපවහන පද්ධති වැඩිදියුණු කිරීම හා නාගරික සංවර්ධන ව්‍යාපෘති ආදිය සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු. මි. 27,150කි.

මහනුවර හා ගාල්ල උපායමාර්ගික නගරවලට අමතරව 2016 වර්ෂයේ දී ලෝක බැංකු ආධාර යටතේ පස් අවුරුදු ව්‍යාපෘතියක් (2016-2021) ලෙස යාපනය නගරය තෝරා ගන්නා ලදී. ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 9,750 ක් වන මෙම ව්‍යාපෘතිය මගින් යාපනය නගරයේ මාර්ග හා රථවාහන තදබදය අවම කිරීම, අපවහන පද්ධතිය වැඩිදියුණු කිරීම, නාගරික සංවර්ධනය හා සංස්කෘතික උරුමයන් සුරැකීම සඳහා වන ව්‍යාපෘති සිදු කරනු ලබයි. එමෙන්ම ප්‍රංශ සංවර්ධන ආයතනයේ මූල්‍ය අනුග්‍රහය යටතේ පස් අවුරුදු (2016-2021) ව්‍යාපෘතියක් ලෙස අනුරාධපුර නගරය ද උපාය මාර්ගිකව සංවර්ධනය කළ යුතු නගරයක් වශයෙන් තෝරා ගන්නා ලදී. ඒ යටතේ සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම හා අනුරාධපුර නගරයේ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති අතර එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 10,125කි.

ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ආර්ථික මංපෙත්වලට ඇතුළත්, කොළඹින් පරිබාහිරව පිහිටි වර්ධන විභවතාවක් සහිත නාගරික මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම සඳහා සිව් අවුරුදු (2018-2021) ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරනු ලබන තිරසර නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උපාය මාර්ගික නගර ලෙස සංවර්ධනය කිරීම සඳහා කුරුණෑගල, දඹුල්ල, ත්‍රිකුණාමලය හා රත්නපුර නගර තෝරාගෙන ඇත. මෙහි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මි. 36,900ක් වන අතර එය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක වේ.

- **මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය (2009 - 2019)**

මහ කොළඹ නාගරික ප්‍රවාහන ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ නගර සංවර්ධන උපාංගය හෙවත් පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනයේ (JICA) මූල්‍ය අනුග්‍රහයෙන් ක්‍රියාත්මක වේ. 2007 වසරේ මාර්තු මස ජාත්‍යන්තර සහයෝගීතාව පිළිබඳ ජපන් බැංකුව (JBIC) අතර ඇති කරගත් ණය ගිවිසුම මගින් මෙම ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර සැපයේ.

පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය කොළඹ නගරය තුළ හා ඉන් පිටත ඉතා ජනාකීර්ණ හා තදාසන්න නගර සීමාවලින් පිටතට සංවර්ධනය පැතිරවීම හා එහි මාර්ග තදබදය අවම කිරීමේ අරමුණින් ක්‍රියාත්මක වන ප්‍රමුඛතම මාර්ග ව්‍යාපෘතියකි. මේ යටතේ ප්‍රධාන වශයෙන් කොට්ටාව, කඩුවෙල සහ කඩවත යන නගරවල යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කෙරෙමින් පවතී.

ශක්තිමත් හා තිරසර ආර්ථික වර්ධනයක් උදෙසා කාලය, ඉන්ධන හා රථවාහන නඩත්තු පිරිවැය ආදී වටිනා සම්පත් නාස්තිය අවම කිරීම තුළින් මගීන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා උසස් තත්වයේ යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබන අතර එහි මූලික අපේක්ෂාව වන්නේ මාර්ග තදබදය, ගමනාන්තයන් සඳහා ගතවන කාලය හා රථ වාහන ආපදා අවම කිරීම, පෞද්ගලික ප්‍රවාහන පහසුකම් භාවිතය අධෛර්යමත් කරමින් පොදු ප්‍රවාහන සේවා භාවිතය ධෛර්යමත් කිරීමය. මේ යටතේ කඩුවෙල ප්‍රදේශයේ මාර්ග දෙකක් හා කොට්ටාව - පන්නිපිටිය මාර්ගය මේ වන විටත් ප්‍රතිසංස්කරණය කර අවසන් කර ඇති අතර කොට්ටාව - හෝකන්දර මාර්ගය ප්‍රතිසංස්කරණය කරමින් පවතී. එමෙන්ම ශ්‍රී ලංකාවේ පළමු බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු අවසන් අදියරේ පවතී. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 3,625ක් වන අතර 2019 දෙසැම්බර් මස ව්‍යාපෘතිය නිමකිරීමට අපේක්ෂිතය.

- **සැහැල්ලු දුම්රිය ප්‍රවාහන පද්ධති ව්‍යාපෘතිය / ජයිකා** (2017 - 2026)

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආර්ථික කේන්ද්‍රස්ථානය වන බස්නාහිර කලාපයේ පවතින අධික මාර්ග තදබදය නිසා සිදුවන ආර්ථික හානිය විශාල වන අතරම මේ හේතුවෙන් ඇතිවන පාරිසරික හානිය ද ඉමහත්ය. එබැවින් කොළඹ නගරයේ ප්‍රධාන මාර්ගවල පවතින අධික රථවාහන තදබදයට දීර්ඝ කාලීන විසඳුමක් ලෙස සහ කාර්යක්ෂම පොදු ප්‍රවාහන මාදිළියක අවශ්‍යතාවය සලකා අධිවේගී ප්‍රවාහන පද්ධතියක් ලෙස කුළුණු මත ඉහළින් දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති ජාලයක් ස්ථාපිත කිරීමට යෝජනා කර තිබේ.

ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් ජපන් රජයෙන් කරන ලද ඉල්ලීමකට අනුව විශේෂ කොන්දේසි සහිත ආර්ථික සහයෝගිතා ණය යටතේ මාලබේ සිට කොටුව දක්වා (කි.මී 15.8) දිවෙන සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයේ මූල්‍ය අනුග්‍රහය ලැබිණි. එහි මුළු ඇස්තමේන්තුගත පිරිවැය රු.මි. 342,392 කි. 2018 වසර අවසන් වනවිට මෙම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය ලැබී ඇති අතර සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පද්ධති නියාමනය සඳහා සකස් කරන ලද ශ්‍රී ලංකා සැහැල්ලු දුම්රිය සංක්‍රමණ පනත් කෙටුම්පත නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

## 5.2 දේශීය අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

- **බස්නාහිර කලාපීය ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය (2017 – 2024)**

ප්‍රවාහන ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා බස්නාහිර කලාපීය මහානගර ප්‍රධාන සැලැස්ම යටතේ සවිස්තරාත්මක ප්‍රවාහන සැලැස්මක් සකස් කර ඇති අතර එමගින් මංපෙත් අතර සම්බන්ධතා වැඩිදියුණු කිරීම හා බහුවිධ ප්‍රවාහන ක්‍රම සහිත ගමනාගමන පහසුකම් සැපයීම හා යටිතල පහසුකම් වර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

මෙම ව්‍යාපෘතිය යටතේ බස්නාහිර කලාපීය සැහැල්ලු දුම්රිය සංක්‍රමණ ව්‍යාපෘති තුනක් (මාළඹේ-කොටුව, කැළණිය-මොරටුව, රාගම-කිරුළපන, හුණුපිටිය-කොට්ටාව - කි.මී. 83.6ක දිගින් යුත්) රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර කඩවත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදි කිරීම, බස් ප්‍රමුඛතා මංතීරු ක්‍රියාත්මක කිරීම හා පොල්දූව කොස්වත්ත අතුරු මාර්ගය ඉදිකිරීම ආදී ව්‍යාපෘති සිදුකරමින් පවතින අතර මෙම ආයෝජනවල ඇස්තමේන්තු ගත පිරිවැය රු. මිලි. 797,000 කට අධිකය.

- **බස්නාහිර කලාපීය තාක්ෂණ නගර සංවර්ධන ව්‍යාපෘතිය (2017 – 2020)**

ශ්‍රී ලංකාව තුළ සිටින විභව ආයෝජකයින් සහ විභව නවෝත්පාදකයින් තාක්ෂණ නගරය වෙත ආකර්ශනය කර ගැනීම මෙන්ම නවෝත්පාදනයන් වාණිජකරණය කිරීමේ ක්‍රියාවලිය සඳහා යටිතල පහසුකම් සහ ඉහළ කුසලතා සපිරි වෘත්තීය ශ්‍රම බලකායේ සහයෝගිත්වය ලබා ගැනීම තුළින් එකිනෙකා සමඟ සම්බන්ධ වීම පිණිස සුදුසු වේදිකාවක් තනා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ යටතේ 2018 වසර තුල තාක්ෂණ නගරයෙහි මාර්ග පහසුකම් සංවර්ධනය සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලි. 6,901ක් වූ ව්‍යාපෘති 5ක් ආරම්භ කර ඇත.

- **බස්නාහිර කලාපීය ගුවන් නගර සංවර්ධන ව්‍යාපෘතිය (2017 – 2022)**

ගුවන් නගරය යනු ගුවන්තොටුපොළ මත රඳා පවතින, ඉහළ වටිනාකම් සහිත, කාලය හා සංවේදී සමාගම්වලට හා ඔවුන්ගේ දුරස්ථ සැපයුම්කරුවන්ට, ගනුදෙනුකරුවන් සහ ව්‍යාපාර හවුල්කරුවන් සමග වේගයෙන් සම්බන්ධ වීම සඳහා ඉඩම්, ප්‍රවාහන, යටිතල පහසුකම් යනාදිය ඒකාබද්ධ කර ඇති නව නාගරික ආකෘතියකි. එය ගුවන්තොටුපොළ කේන්ද්‍ර කරගත් බහුවිධ සේවාවන් සහිත වූ වාණිජ මධ්‍යස්ථානයකින් සහ පිටත කොරිඩෝවකින් සමන්විත වන අතර ගුවන් සේවා ආශ්‍රිත ව්‍යාපාර කලාපයක් සහ ගුවන්තොටුපොළ වෙත පහසුවෙන් ප්‍රවේශ විය හැකි සහ අන්තර් පහසුකම් සපයනු ලබන මිශ්‍ර වාණිජ / නාගරික සංවර්ධන කටයුතු සම්බන්ධ කරන පරිශ්‍රයක් වේ. මේ යටතේ ඒකල ප්‍රවර්ජන සහ ව්‍යාපාර උද්‍යානය, කටුනායක 18 වන සැතපුම් කණුව ආශ්‍රිත බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ප්‍රවේශ ව්‍යාපෘතිය, කටාන ගුවන් සේවා ඇකඩමිය සහ කටාන ගුවන්තොටුපොළ ව්‍යාපාරික නගර ව්‍යාපෘතියෙහි කටයුතු ආරම්භ කර ඇති අතර එහි ශ්‍රී ලංකා රජයේ ආයෝජනයන්හි ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලි. 2,500කට ආසන්න වේ.

- **බස්නාහිර කලාපීය සමුද්‍රීය නගර සංවර්ධන ව්‍යාපෘතිය (2017 – 2021)**

මෙම ව්‍යාපෘතිය බස්නාහිර කලාපීය මහානගර සැලසුම මගින් හඳුනා ගන්නා ලද ගුවන් සමුද්‍රීය වෙළඳ කේන්ද්‍රස්ථානය යන තේමාව යටතේ ක්‍රියාත්මක වන අතර මෙමගින් බහුකාර්ය සමුද්‍රීය කලාපයක් සංවර්ධනය කිරීමට අපේක්ෂිතය. මේ යටතේ බිලුමැන්ඩල් ප්‍රදේශය සංවර්ධනය කිරීම , කොල්ලුපිටියේ සිට දෙහිවල දක්වා වෙරළ තීරය විනෝදකාමී ප්‍රදේශයක් වශයෙන් සංවර්ධනය කිරීම මෙන්ම වැලිසර ප්‍රවර්ජන උද්‍යානය හරහා සමස්ත ප්‍රවර්ජන මෙහෙයුම් කටයුතු ඉහළ නංවාලීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ ආයෝජන පිරිවැය රු. මිලි. 34,150කට අධිකය.

- **බස්නාහිර කලාපීය පරිපාලන නගර සංවර්ධන ව්‍යාපෘතිය (2017 – 2023)**

මෙම ව්‍යාපෘතිය මගින් රුපියල් බිලියන 40කට අධික වටිනාකමකින් යුත් සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීමට අපේක්ෂිත අතර රාජ්‍ය,-පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ සංවර්ධන කටයුතු සිදු කිරීමට අපේක්ෂාවෙන් සිටින විභව සංවර්ධනකරුවන් දිරිගැන්වීම හා අනාගත සංවර්ධනකරුවන්ට ඔවුන්ගේ සංවර්ධන සංකල්ප ක්‍රියාත්මක කිරීම සඳහා සහාය දක්වනු ඇත. පරිසරය, තිරසරබව, මහජන අවශ්‍යතා සහ ශක්‍යතා ආදියට අනුකූල වීම සහතික කිරීම සඳහා ව්‍යාපෘතිය මගින් සම්පූර්ණ ව්‍යාපෘති කාලය තුළ සංවර්ධන/ආයෝජන නිර්ණායක ඇගයීම සිදු කරනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ යෝජිත බහුමහල් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය (සෙත්සිරිපාය අදියර - IV) බත්තරමුල්ල මංසන්ධියේ යෝජිත බහුමහල් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය, පිටකොටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය, පරිපාලන නගරය සඳහා සූර්ය බලශක්ති ව්‍යාපෘතිය, බත්තරමුල්ල මංසන්ධිය හා පොල්දූව මාර්ගය සම්බන්ධකරන මාර්ගය ඉදි කිරීම, පාර්ලිමේන්තු කටයුතු ආශ්‍රිත ලේකම් කාර්යාල පරිශ්‍රය ඉදිකිරීම, පරිපාලන නගරය තුළ වර්තමාන හා අනාගත මාර්ග ජාලයන්හි භූ අලංකරණ කටයුතු, කෝට්ටේ බලකොටුව පරිශ්‍රයෙහි යෝජිත චීන - ශ්‍රී ලංකා කෞතුකාගාරය ඉදි කිරීම, ශ්‍රී ලංකාවේ ප්‍රවීන කලාකරුවන් සඳහා යෝජිත නිවාස ව්‍යාපෘතිය හා 2020 සුහුරු පරිපාලන නගර ව්‍යාපෘතිය ආදියෙහි මූලික කටයුතු 2018 වසර තුළ සිදුකර ඇත.

- **සහසර ව්‍යාපෘතිය (2018 – 2023)**

ආර්ථිකයට බරක් එක් කරමින් කඩා වැටෙමින් පවතින පොදු ප්‍රවාහන සේවයේ පවතින ගැටළුවලට පිළියමක් ලෙස සහසර ව්‍යාපෘතිය ආරම්භ කොට තිබේ. විශ්වසනීයත්වය, ගුණාත්මකභාවය සහ සුවපහසුව, කෙටි දුර ධාවනය සඳහා දිගු කාලයක් වැයවීම, බස් රථ අතර තරඟය, බස් රථ තුල පවතින තදබදය, බස් හිමියන් අඩු ලාභයක් ලැබීම, ව්‍යාපාරික අවධානය අඩුවීම, අඩු ඵලදායීතාව, කාර්යබහුල වේලාවන්හීදි ගමන් වාර ලබා ගැනීම සඳහා නීති විරෝධී ක්‍රම භාවිතය, රැකියා සුරක්ෂිතභාවය හෝ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ නොමැති වීම හේතුවෙන් ඉහළ සේවක පිරිවැටුම (විශේෂයෙන් ම පෞද්ගලික අංශය තුළ) ආදිය මෙම ගැටලුව සඳහා සාක්ෂි සපයන අතර මෙම සාධකවල අඛණ්ඩ පැවැත්ම කර්මාන්තය තව දුරටත් පිරිහීමට පාදක වනු ඇත.

සහසර ව්‍යාපෘතිය මගින් මෙම ගැටලු විසඳීම සහ මහජනතාවට වඩා හොඳ බස් ප්‍රවාහන සේවාවක් සැපයීම අරමුණු කරගනිමින් බස්රථ සේවාව කළමනාකරණය, අධීක්ෂණය හා මෙහෙයුම් පාලනය, ආදායම් මාර්ග තක්සේරු කිරීම හා බස් හිමියන් සඳහා ගෙවීම් කිරීම සිදු කරනු ඇත. පෞද්ගලික ආදායම එකතු කිරීම සහ ඉහළ ගුණාත්මක බස්රථ සහ වඩා කාර්යක්ෂම ගමන් වාර ලබා දීම මගින් බස් රථ ප්‍රවාහනය වර්ධනය කිරීමත් එමගින් වඩා විධිමත් රැකියා අවස්ථා සඳහා අවිධිමත් පුද්ගලික බස් සේවකයින් දිරිමත් කිරීම, ව්‍යවස්ථාපිත ගෙවීම්, මාසික වේතන සහ වෙනත් පහසුකම් ලබාදීම තුළින් රැකියා සුරකුම් සහතික කරනු ඇත.

මෙම ව්‍යාපෘතිය යටතේ සහසර මගී ප්‍රවාහන ප්‍රතිසංස්කරණ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලද අතර, බහුපාර්ශවික අධාරකරුවන් හා මුල්‍යායතන සමග කටයුතු කිරීම, මධ්‍යම හා බස්නාහිර පළාත් සභා සහ පළාත් ප්‍රවාහන අධිකාරීන් සමග සහසර ප්‍රතිසංස්කරණ සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ආරම්භ කිරීම, පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, උපදේශක සේවා සපයා ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය මූලික කටයුතු කිරීම ආදිය 2018 වසර තුල සිදුකර ඇත. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලි.26,000කට ආසන්න වේ.

- **කොළඹ අගනගරය ආශ්‍රිත ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ ව්‍යාපෘතිය (2017 - 2020 )**

මෙම ව්‍යාපෘතිය යටතේ මහ කොළඹ කලාපය තුළ එක්රැස් වන නාගරික ඝන අපද්‍රව්‍ය, අරුවක්කාළු ප්‍රදේශයේ පිහිටුවීමට නියමිත සනීපාරක්ෂක කසළ රැඳවුම වෙත ප්‍රවාහනය කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ඇ.ඩො.මිලි. 120.41ක් වන අතර මෙය පැකේජ 4ක් ඔස්සේ ක්‍රියාත්මක වේ.

- A පැකේජය (මාරු කිරීමේ මධ්‍යස්ථාන කැලණිය සහ අරුවක්කාළු ප්‍රදේශවල ඉදිකිරීම)
- B පැකේජය (අරුවක්කාළු ප්‍රදේශයේ සනීපාරක්ෂක කසල රැඳවුම ඉදි කිරීම)
- C පැකේජය (දුම්රිය මාර්ග විස්තාරණය සහ සම්බන්ධතා මාර්ගය ඉදිකිරීම)
- D පැකේජය (දුම්රිය උපකරණ, යන්ත්‍රෝපකරණ සහ වෙනත් දියුණු කිරීම් සඳහා ප්‍රසම්පාදනය)

2018 දෙසැම්බර් අවසානය දක්වා මෙම ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය 47%කි.

කොළඹ නගරය පිරිසිදු නගරයක් කිරීමේ අරමුණින් ආරම්භ කරන ලද "නිකසල පුරවර" වැඩසටහන යටතේ 3R සංකල්පය අනුව කසල එකතු කිරීමේ මධ්‍යස්ථාන පාසල් මට්ටමින් හා නිවාස සංකීර්ණ මට්ටමින් ස්ථාපිත කිරීම, තෝරාගත් නිවාස සංකීර්ණවල තෝරාගත් පුද්ගලයන් සඳහා කසල කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දී අදාළ නිවාස සංකීර්ණයන්හි ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන්වල කාර්යභාර නිලධාරීන් ලෙස පත්කිරීම ද සිදුකර ඇත.

- **වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය (2016 – 2019)**

හෙක්ටයාර 269ක සමුද්‍රීය භූමි ප්‍රමාණයක් ගොඩකර ඉදිකරනු ලබන කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය ශ්‍රී ලංකාවේ මධ්‍යම ව්‍යාපාරික දිස්ත්‍රික්කය පුළුල් කරමින් ඉදිවන නවීනතම නගර සංවර්ධන ව්‍යාපෘතියකි. ඉන්දීය සාගරයේ උණුසුම් ජලධාරාව ඔස්සේ සැලසුම් සහගතව ඉදිකෙරෙන මෙම අසමසම නගරය දකුණු ආසියාවේ ප්‍රමුඛතම නේවාසික හා ව්‍යාපාරික ස්ථානය වනු ඇත.

කොළඹ වරාය නගරය දකුණු ආසියානු කලාපය තුළ ජීවත් වීමට, වැඩ කිරීමට සහ ක්‍රීඩා කිරීමට සුදුසු පරිසරයකින් යුතු ඉතාමත් ආකර්ෂණීය නගරය වනු ඇත. ජාත්‍යන්තර මට්ටමේ මෙම ව්‍යාපෘතිය සීඝ්‍රයෙන් වැඩි වන දේශීය ජනගහනයට සහ විනෝදාත්මක සහ ව්‍යාපාර යන අංශ සමග බැඳුණු සංචාරක කර්මාන්තයේ සීඝ්‍ර දියුණුවට ද රුකුලක් වෙමින් කලාපයට සංවර්ධන උපායමාර්ග ගණනාවක් එක් කරනු ලබයි. ඒ අනුව, මෙම වරාය නගරය, ආසියාව සහ බටහිර අතර මනා සබඳතාවයක් ඇති කරමින් කලාපය තුළ අනාගත අභිවෘද්ධිය සඳහා ප්‍රවේශය සපයනු ඇත.

**කාර්යසාධනය**

**භෞතික කාර්යසාධනය - 2018 දෙසැම්බර් අවසානය දක්වා**

| ව්‍යාපෘතිය ආශ්‍රිත සංරචක | කාර්යසාධනය (%) |
|---|---|
| **දේශීය සංරචකය (ඇ.ඩො.බිලි. 1.0)** | |
| නව කැලණි පාලමේ සිට ඉහළින් ඉදිවන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය | සිදු කෙරෙමින් පවතී |
| වෙරළබඩ මාර්ගයේ (Marine Drive) සිට ඉහළින් ඉදිවන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගය දක්වා වන උමං මාර්ගය | ශක්‍යතා අධ්‍යයනය සහ පාරිසරික බලපෑම් අධ්‍යයනය අවසන් කර ඇත. |
| සැහැල්ලු දුම්රිය සංක්‍රමණ මාර්ගය කොටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා වරාය නගරය සමග සම්බන්ධ කිරීම | ශක්‍යතා අධ්‍යයනය අවසන් කර ඇත. |
| ජලය, විදුලිය සහ මලාපවහන ජාලය | වරාය නගර සීමාව දක්වා සම්බන්ධිත ස්ථාන ස්ථාපිත කොට ඇත. |
| **විදේශීය සංරචකය (ඇ.ඩො.බිලි. 1.4)** | |
| නිර්මාණය | 97% |
| ගොඩකිරීම | 95% |
| භූමිය සංවර්ධනය | 80% |

**මූල්‍ය ප්‍රගතිය - 2018 දෙසැම්බර් අවසානය දක්වා**

| සංරචකය | කාර්යසාධනය | | |
|---|---|---|---|
| | ප්‍රතිපාදන | වියදම | % |
| දේශීය සංරචකය (ඇ.ඩො.බිලි. 1.0) | රු.මිලි. 3,335 | රු.මිලි. 3,255 | 98 |
| විදේශීය සංරචකය (ඇ.ඩො.බිලි. 1.4) | | ඇ.ඩො.මිලි. 700 | 50 |

- **ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුමක් සකස් කිරීම (2017 - 2018)**

රු.මි. 149.78ක වියදමින් සිංගප්පූරුවේ Surbana Jurong සමාගමේ සහයෝගයෙන් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය සඳහා ප්‍රධාන සැලසුම සකස් කර අවසන් කර ඇත. මේ යටතේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම්, සංචාරක, කර්මාන්ත හා ත්‍රිකුණාමල වරාය ආශ්‍රිත සංවර්ධනය ආදී ක්ෂේත්‍ර සඳහා අවශ්‍ය කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන උපාය මාර්ගික ව්‍යාපෘති යෝජනා කර ඇත. යෝජිත ව්‍යාපෘති හා සංවර්ධන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමට අදාලව මූලික සැලසුම නීතිගත කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය හා අනෙකුත් පළාත් පාලන ආයතන වෙත යොමු කර ඇත.

- **නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය (2012 - 2019)**

නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ නගරය සහ එයට ආසන්න ප්‍රදේශවල අඩු පහසුකම් සහිත ජනාවාස නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා නිවාස ඒකක 60,000ක් ඉදිකිරීමේ අරමුණින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. 2013 සිට 2018 දෙසැම්බර් අවසානය දක්වා ප්‍රධාන ව්‍යාපෘති 16ක් යටතේ නිවාස ඒකක 8,113ක් ලබා දී ඇත. එමෙන්ම, නිවාස ඒකක 7,694ක් සහිත ව්‍යාපෘති 12ක් මේ වන විට ක්‍රියාත්මක වෙමින් පවතී.

## ආයතනික සංවිධාන ව්‍යුහය

## මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

ඇමුණුම 01

